## 2020/08/11 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2020/08/11 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

### 01. ආගම සිහි කිරීම

2020.08.11 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සියලු දෙනාටම සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරනවා. අද දින සභාවාරයට පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුලු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා පිළිගන්නවා. විශේෂයෙන්ම, මට උදවු වෙන්න කියලා, සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා. මම ගියවර සභාවෙ කිව්ව වගේ රටට අනාගතයට සුබ යහපත් දේශපාලන වාතාවරණයක් උඩ තමයි අද අපි සභාව මෙහෙයවන්න පටන් ගන්නෙ. ඔබ අපි කවුරුත් දන්නවා. අගෝස්තු පස්වෙනිදා ශ්‍රී ලංකාවේ දිශානතිය නියම කරන මහ මැතිවරණය තිබුනා. ඒ අනුව සියලුම පක්ෂ අභිබවා අති විශිෂ්ඨ අන්දමින් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ ජයග්‍රහණය කරලා, අපි බලාපොරොත්තු වුන තුනෙන් දෙකේ බලයක් ලබා ගෙන, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගේ සෞභාග්‍යයේ දැක්ම යථාර්තයක් බවට පත් කරන්නට, මුලු ශ්‍රී ලංකාවාසී ජනතාව 59% ක ප්‍රතිශතයකින් ඡන්දය ලබා දුන්නා. ශ්‍රී ලංකාවේ බලාපොරොත්තු යහපත් අන්දමින් ඉටුවෙන්න කරුණු කාරනා සැලසිලා තියෙනවා. විශේෂයෙන්ම පසුගිය කාලවකවානුවල යම් වැඩ කොටසක් කර ගන්න හැකියාව නොලැබුනත්, ඉදිරියෙදි දිස්ත්‍රික් නායකත්වය, ආසන නායකත්වය හා ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහ ජනාධිපතිතුමාගේ ආධාර උපකාර අරගෙන විශාල වැඩ කොටසක් කරන්න පුලුවන් වේවි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ වගේම, එක්සත් ජාතික පක්ෂ,ය සමගි ජන බලවේගය, අපේ ජන බලවේගය හා ජනතා විමුක්ති පෙරමුණ අපි සියලුම දෙනා එකාවන්ව අපේ ගමට අපට වැඩක් කරන්න අපි බලාපොරොත්තු වෙමු. වෙනදා වගේම මෙම සභාවාරය සාර්ථක අන්දමින් පැවැත්වීම සඳහා ඔබ සියළු දෙනාගේ සහය අපේක්ෂා කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

01. ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි. නෙරංජලී මහත්මිය විසින්, තමන් වෙනත් කරුණු යටතේ දැක්වූ අදහස් 2020.07.13 දිනැති සභා වාර්තාව තුල අන්තර්ගත වී නොමැති බව එතුමිය විසින් පෙන්වා දෙන ලදී.

02. ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් 2020.07.13 දින සභා රැස්වීමේදී වෙනත් කරුණු යටතේ සඳහන් කරන ලද නාගොඩ මංසන්දියේ සිට උඩවැලිවිටිය රැකඩහේන දක්වා ගමන් කරන මාර්ගය දෙපස ඇති අවහිරතා, ඉඩම්වල අවහිරතා ඉවත් කර දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් හරහා සිදු කිරීමට ඉල්ලීමක් කරන ලෙස සඳහන් කලද, සභා වාර්තාවේ එය නිවැරදිව සඳහන් නොවී ඇති බව පෙන්වා දෙන ලදී.

**(අ)02. 2020.07.13 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

ඉහත සඳහන් කරන ලද සංශෝධනයන්ට යටත්ව, 2020.07.13 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු **මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. රියදුරු, බී.ජී.පියතිලක මයා විසින් RA 8569 දරණ ට්‍රැක්ටරය සම්බන්ධව 2020.08.10 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම සභාගත කරන ලදී.

02. සිසිර ස්ටෝර්ස්, ගල්කන්ද, ඌරල විසින් කසල ඉවත්කිරීම සම්බන්ධයෙන් 2020.08.11 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම සභාගත කරන ලදී.

03. ඩබ්ලිව්.වී. දිනේෂ් ප්‍රියංග කුමාර, බද්දේගම විසින් උනන්විටිය අඟහරුවාදා සති පොළ සභාවට නැවත භාරදීම සම්බන්ධව 2020.08.11 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**ගරු සභාපතිතුමා විසින් උනන්විටිය පොල සම්බන්ධව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට තීරණය කරන ලදී.**

04. එච්.පී.දයාරත්න,කොතේගොඩකන්ද, ඌරල විසින් නව කොන්ක්‍රීට් මාර්ගය සම්බන්ධව යොමු කරන ලද 2020.07.17 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**කොතේගොඩ කන්ද නව කොන්ක්‍රීට් මාර්ගය පරීක්ෂා කිරීම සඳහා තාක්ෂණ නිලධාරී යොමුකළ අතර තාක්ෂණ නිලධාරී වාර්තාව අනුව, මේ සම්බන්ධව ඉදිරි කටයුතු කිරීම සඳහා ප්‍රදේශීය ලේකම් වෙත යොමු කිරීමට තීරණය කරන ලදී.**

05. ඌරල පහළ , අක්කර 25 ප්‍රදේශවාසීන් විසින් ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක අනවසර ලෙස පස් දමා අවහිර කිරීම සම්බන්ධව 2020.08.11 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**පාරට පස් දැමීම සම්බන්ධව පරීක්‍ෂා කර බැලීම සඳහා තාක්‍ෂණ නිලධාරී යොමු කිරීමටත්, තාක්‍ෂණ නිලධාරී වාර්තාව අනුව කටයුතු කිරීමටත් තීරණය කරන ලදී.**

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

**01.** පසුගියදා අපවත් වී වදාළ උනන්විටිය ශ්‍රී විජයාරාමාධිපති, ගාලු දිශාවේ ප්‍රධාන අධිකරණ සංඝනායක ධර්මකීර්ති ශ්‍රී රේවත රාජකීය පණ්ඩිත වැයිහේනේ සුමන නායක ස්වාමීන් වහන්සේගේ තුන් මස දානමය පිංකමට සමගාමීව උනන්විටිය කුකුළුවැල්දූව මාර්ගය එම නාහිමියන්ගේ නමින් නම් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

02. නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් ගිණුම්වලට අදාළ චෙක්පත්වල දෙවන අත්සන්කරු ලෙස කටයුතු කරනු ලබන හංසිකා මුතුමාලි හේවාවිතාන මහත්මිය ස්ථාන මාරු නියෝග ලබා ඇති බැවින්, චෙක්පත් අත්සන් කිරීමේ බලතල අවලංගු කොට 2020.08.19

දින සිට එම්.ඒ.ඩිලානි චන්ද්‍රප්‍රභා මහත්මියට චෙක්පත්වල දෙවන අත්සන්කරු ලෙස කටයුතු කිරීමට බලය පැවරීමට යෝජනා කරමි.

- ❖ තල්ගස්වල මහජන බැංකුව ( පොදු අරමුදල්) – 272100110000027
- ❖ තල්ගස්වල මහජන බැංකුව ( සේවක ණය) - 272100150000030
- ❖ තල්ගස්වල ලංකා බැංකුව ( රජයේ ආධාර) - 0004766271

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

03. 4/2005 චක්‍රලේඛය මගින් කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන අය සඳහා වැටුප් සහිත ප්‍රසූත නිවාඩු හිමි නොවන බව පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් දන්වා ඇති අතර, කොන්ත්‍රාත් පදනම මත සේවය සඳහා බඳවා ගැනීම ගිවිසුම්ගත කාලයක් සඳහා පමණක් වන බැවින් ඒ අය සඳහා දරු ප්‍රසූතිය සිදු වූ දින සිට රජයේ වැඩ කරන දින 84 ක කාලයක් වැටුප් රහිත ප්‍රසූත නිවාඩුවක් පමණක් හිමි වන බව දන්වා ඇත. එබැවින් උඩුගම නැගෙනහිර රන් කැකුළු පෙර පාසලේ පෙර පාසල් පාලිකාතුමියට 2020 ජුනි මාසය සඳහා ගෙවන ලද මාසික දීමනාව කොටස් වශයෙන් නැවත අය කර ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

04. 2020.07.13 වන දින පැවති පසුගිය මස මහා සභාවේ ඉදිරි ගෙවීම් වාර්තාවේ සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව යටතේ 9(ii) හි සඳහන් කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් සහන ලබා දීම සඳහා රු. 500000.00 ක මුදලක් ලබා ගැනීමේ වියදම සම්බන්ධව අනුමැතිය ලබා දීම කල් තබන ලද අතර, ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

2020.07.13 දින සභා වාර්තාව තුල ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් 9(ii) ගෙවීම සම්බන්ධව තව දුරටත් සාකච්ඡා කිරීම අනවශ්‍ය බවත්, අපේ ස්ථාවරය නොවෙනස්වන බවත්, ඉදිරියේදී එවැනි කටයුතු කිරීමේදී නිවැරදිව සිදු කරන ලෙසත්, අදාළ ගණුදෙනුව අනුමත කර ගන්නා ලෙසත්, ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා සහ ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා සභාවට දැන්විය.

**ඒ අනුව, 2020.07.13 දින සභා වාර්තාව තුල ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් 09 (ii) ගෙවීම සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**05.ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**<u>2020.08.11 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2020 ජූලි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 240.00 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු10842.40 |
| 8617046104 | - උඩුගම බහුකාර්‍ය මධ්‍යස්ථානය | - රු. 534.90 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1612.50 |

| | | |
|---|---|---|
| 4509082908 | - උක්ඹිවිට පෙර පාසල | - රු. 240.00 |
| 4507357802 | - සමනළ පෙර පාසල | - රු. 240.00 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 1338.00 |
| 8619142704 | - රන්කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 880.50 |
| 4501090200 | - මාපලගම වෙලඳ සංකීර්ණ කොරිඩෝව | - රු. 349.80 |

**2020 ජුනි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4507357802 | - සමනළ පෙර පාසල | - රු. 240.00 |
| 8619142704 | - රන්කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 953.70 |
| 4509082800 | - උදාර පෙර පාසල | - රු. 240.00 |

**2020 මැයි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 8619142704 | - රන්කැකුළු පෙර පාසල | - රු. 267.45 |

**2020 අප්‍රේල් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4509082800 | - උදාර පෙර පාසල | - රු. 240.00 |

**02.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

| | | |
|---|---|---|
| 33/53/003/008/11 | - උඩුගම උප කාර්යාලය (2020.06.22 – 2020.07.21) | -රු. 287.10 |
| 33/53/003/009/10 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2020.06.22- 2020.07.21) | -රු. 5328.97 |

**03. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සි**

**දුරකථන බිල්පත් ගෙවීම** (2020.07.01 - 2020.07.31)

| | | | |
|---|---|---|---|
| i. | 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු. 4526.80 |
| ii. | 0912296537 | - සභාපති නිල කාමරය | - රු. 3306.99 |

**04. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**

උප සභාපතිතුමාගේ නිවසේ දූරකථන බිල්පත පියවීම 091-5701722
(2020.06.16- 2020.07.15) - රු. 613.01

උප සභාපතිතුමාගේ නිවසේ දූරකථන බිල්පත පියවීම 091-5701722
(2020.02.16- 2020.03.15) - රු. 613.01

**<u>05 .2020 ජූලි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 6200.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**<u>06. 2020 ජූලි මස ගමන් වියදම්</u>**

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| වයි.ජී. ගංගා පද්මිණී මෙය | - පුස්තකාල සහායක | - රු. 1756.00 |

**<u>2020 ජූලි මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු. 1000.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 2800.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරි | - රු. 530.00 |

**<u>07. අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2020 ජූලි මස</u>**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9046.40 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 7650.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 1652.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 7149.78 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 5605.50 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 7704.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 6374.50 |
| චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3267.00 |
| යූ.ජී.උපනාම මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1337.38 |
| උපුල් ධර්මසිරි මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1184.50 |

**08. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2020 ජුනි මස මන්ත්‍රී ඉන්ධන දීමනා ලබා ගැනීමේ බිල්පත - රු. 78000.00

ii. 2020.07.27 වන දින සභාවේ පවත්වන ලද තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහා සහභාගී වූ නිලධාරීන් සඳහා දීමනා ගෙවීම - රු. 3500.00

iii. පළාතේ මාර්ග පවිත්‍රතා සතියක් ක්‍රියාත්මක කිරීම පෙබරවාරි 24 සිට 28 දක්වා වැඩසටහනට අදාලව සභාව මිළදී ගත් ද්‍රව්‍ය සඳහා වියදම් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු.12950.00

iv. නාගොඩ ප්‍රාදේශීය සභාවේ කසල කලමනාකරණ කටයුතුවල නියලෙන සේවකයින් සඳහා සබන් ලබා දීම ( සෞඛ්‍ය කම්කරුවන් සහ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් සඳහා අප්‍රේල්, මැයි, ජුනි මාසයන් සඳහා ) - රු. 6460.00

**09. ලංකා ෆිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2020 ජූලි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 571ක් | - රු. 59384.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 250 ක් | - රු. 26000.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 185 ක් | - රු. 19240.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 200 ක් | - රු. 20800.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 70 ක් | - රු. 7280.00 |
| LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 50 ක් | - රු. 5200.00 |
| තණකොල කැපීම සඳහා පෙට්‍රල් ලීටර් 30 | - රු. 4110.00 |
| 2T Oil | - රු. 580.00 |
| **එකතුව** | **<u>- රු.142594.00</u>** |

**10.නීතිඥ හේමන්ත පී.ඩබ්.විතාරණ මයා, ගාල්ල**

i. 2020.07.03 දින පැවති එල් 16242දරණ නඩුව වෙනුවෙන් නීතිඥ හා පෙනී සිටීමේ ගාස්තු - රු. 3000.00

ii. 2020.07.23 දින පැවති එම්.343 දරණ නඩුව වෙනුවෙන් නීතිඥ, අධි නීතිඥ, පෙනී සිටීමේ ගාස්තු, ලේඛන සකස් කිරීමේ ගාස්තු - රු. 15000.00

**iii.** 2020.05.12 දින පැවති පී 14658 නඩුවට අදාළ නීතිඥ හා පෙනී සිටීමේ ගාස්තු - රු. 10000.00

**11. කේ.ටී.ආර්.ජී. උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ**

i. PF 7360 කැබ් රථය අළුත්වැඩියා කිරීමේ ගාස්තු - රු. 28800.00

**12. ආසිරි ටයර් ට්‍රේඩර්ස්, මාපලගම**

252 6478 කැබ් රථයේ සුක්කානම් කවරය හා එයාර්ෆෙෂ්නර් යෙදීමේ බිල්පත - රු. 1170.00

**13. ඊ බේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම**

i. පරිගණක උපාංග මිළදී ගැනීමේ බිල්පත - රු. 58800.00

ii. නව පරිගණක සඳහා මෘදුකාංග ඇතුලත් කිරීමේ ගාස්තු - රු. 1400.00

iii. ප්‍රධාන කාර්යාලයේ ප්‍රින්ටර් යන්ත්‍රය සඳහා ටෝනර් ලබා ගැනීමේ බිල්ප - රු. 52000.00

**14. එස්.ජේ.පී. ස්ටේෂනරි, ගාල්ල**

ප්‍රධාන කාර්යාලයට ලිපිද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත - රු. 17770.00

**15. උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම**

i. SPRA 8886 ගාබේජ් ට්‍රේලරය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 96700.00

**16. ඒ.ඩී.කරුණාරත්න මයා, නාගොඩ**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2020 ජූලි - රු. 6880.00

**17.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 අගෝස්තු මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු27500.00

ii. 2020 ජූලි මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු.2100.00

**18. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා අගෝස්තු මස මාසික කුලීය ගෙවීම - රු. 5000.00

**19. විගණකාධිපති, විගණන කාර්යාලය**

හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**20. සඳරු ග්‍රයින්ඩින් ඇන්ඩ් ග්‍රොසරි, නාගොඩ**

ප්‍රාදේශීය සභාවේ 2020.07.13 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත- රු. 4802.00

**21. ඊ.කේ.චමින්ද කපිල මයා, නාගොඩ**

බුදපනාගම සමනල පෙර පාසලේ පොදු ළිඳ ඉසීම වෙනුවෙන් දරන ලද වියදම පියවීම - රු. 1100.00

**22. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2020 ජූලි) - රු.13000.00

**23. සිංහගිරි පොත්හල, උඩුගම**
252-6478 කැබ් රථයේ මතුපිට ආවරණ රෙදි ලබා ගැනීමේ බිල්පත - රු. 450.00

**24. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**
i. වීථි පහන් නඩත්තු කටයුතු සඳහා තම්බ්ලර් ස්විච් ලබා ගැනීමේ බිල්පත - රු. 5180.00
ii. පෙර පාසල් 9 ක් සඳහා වන ස්ප්‍රේ බෝතල් 09 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 1350.00
iii. හදිසි අවශ්‍යතාවය මත CFL බල්බ් 02 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 1100.00
iv. උඩුගම උප කාර්යාලයේ ඇගිලි සළකුණු යන්ත්‍රය සඳහා ප්ලග් බේස් එකක් ලබා ගැනීමේ බිල්පත - රු. 430.00

**25. ගෙස්ටෙට්නර් සිලෝන් ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ**
ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.26136.00

**26. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**
පී එෆ් 7360 කැබ් රථයේ සේවා කිරීමේ බිල්පත පියවීම - රු. 17070.00

**27. කේ.එම්.ටී.ඩිස්ට්‍රිබියුටර්ස්, ගාල්ල**
වීථි පහන් නඩත්තු සඳහා වොල්ට් 23 සී.එෆ්.එල් බල්බ් 30 ක් ලබා ගැනීමේ බිල්පත - රු.12900.00

**28. ඩී.ආර්.ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්, උඩුගම**
පරිගණක මේස 03 ක් සහ පුටු 02 ක් උඩුගම පුසතකාලය සඳහා පොත් රාක්ක 05 ක් මිළදී ගැනීමේ බිල්පත - රු.107415.00

**29. දසමස් වැටුප් අත්තිකාරම්**
i. ඩබ්.ඒ. චමරි මධුෂානි මිය - රු.250000.00

**30. සෙත්රෝ ෆාමසි, පිටිගල**
i. පාර්ලිමේන්තු මැතිවරණ කටයුතු සඳහා භාවිතා කරන ඡන්ද මධ්‍යස්ථාන විෂබීජහරණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් ලබා ගත් කොරෝනා කිට් සඳහා බිල්පත - රු. 2770.00
ii. පෙරපාසල් 15 ක විෂබීජහරණ කටයුතු සිදු කිරීමට අත් සෝදන දියර ලීටර් 05 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 16200.00

**31. සදර්න් ඇග්‍රෝ සර්විස්, වක්වැල්ල**
විෂබීජහරණ කටයුතු සඳහා ලබා ගත් ස්ප්‍රේ යන්ත්‍ර 02 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 5300.00

**32. ජානක මෝටර්ස් ඇන්ඩ් හාඩ් වෙයාර්, නාගොඩ**
පෙර පාසල් 6 ක් සඳහා වන ස්ප්‍රේ බෝතල් 06 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 960.00

**33. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**
ප්‍රාදේශීය සභාවේ 2020.07.13 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත- රු. 6095.00
(කෑම සඳහා)

**34. ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 ජූලි - රු. 5510.00

<u>පොදු අරමුදල් කර්මාන්ත</u>
**35. ආර්.පී.කේ.අබේසිංහ, යටලමත්ත**
රියදුරු විවේක කාමරය සැකසීමේදී බිත්තිය කැඩීම සඳහා ගත් දෙදරුම් යන්ත්‍රය
සඳහා පැය 03 ක කුලීය ගෙවීම - රු. 500.00

**36. ටී.එච්.සී. සම්පත් මයා, උඩුගම**
ගමගොඩ පාරේ කඩා වැටුන බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා PC වර්ගයේ
ස්කවේටර් යන්ත්‍රය සහ කියුබ් 01 ක ටිපර් රථය සේවයේ යෙදීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 16130.00

**37. ලක්දිව් එන්ටර්ප්‍රයිසස්, කොට්ටවගම**
පළාතේ මාර්ග පවිත්‍රතා සතියක් ක්‍රියාත්මක කිරීමට අදාළව අත්මේස් මිළදී ගැනීමේ
බිල්පත ( අත්මේස් 280) - රු. 36400.00

**රජයේ ආධාර පළාත් නිශ්චිත**
**38. කුරුපනාව ගොවි සංවිධානයේ මහජන බැංකුවේ ගිණුම**
උඩුගම පුස්තකාලයේ ජල සැපයුම හා සනීපාරක්ෂක වැසිකිලි පද්ධතිය ස්ථාපනය
කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල ගෙවීම - රු.108931.09

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

නාගොඩ ප්‍රාදේශීය සභාව
වීථි පහන් අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍යා ආරක්ෂිත බඳ පටියක් සහ සපත්තු මිළදී ගැනීම
සඳහා මිල ගණන් කැඳවීම -2020

| විස්තරය | සී/ස රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව ( රු.) |
|---|---|
| ආරක්ෂිත සපත්තු යුගලක් | රු. 4100.00 |
| ආරක්ෂිත බඳ පටියක් | රු. 14500.00 |

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද වීථි පහන් අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍යා ආරක්ෂිත බඳ පටියක් සහ සපත්තු මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව **සී/ස රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව** වෙතින් වීථි පහන් අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍යා ආරක්ෂිත බඳ පටියක් සහ සපත්තු මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2020 ජුනි මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරංශය සළකා බැලීම සඳහා අගෝස්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**පෙ.ව.10.40 ට විනාඩි 15 ක කාලයක් සඳහා සභාව කල්තැබීම**
**පෙ.ව.10.55 ට සභාවේ කටයුතු නැවත ආරම්භ කිරීම**

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අපි අපේ අතිගරු අග්‍රාමාත්‍යතුමාට මේ ලැබුවා වූ ජයග්‍රහණයත් එක්ක සුභාශිංසන එක් කරන ගමන්, ඒ වගේම ගාලු දිස්ත්‍රික්කයේ දෙවනියට මනාප ලබාගෙන අපේ ආසනයේ සංවිධායකතුමා වන සම්පත් අතුකෝරල මැතිතුමා ඉතා විශිෂ්ඨ ජයග්‍රහනයක් ලැබුවා. එතුමාටත් අපේ සුභාශිංසන එක් කරන ගමන්, ගරු සභාපතිතුමනි, ඌරල පොදු නාන ලිඳ තවම වල් බිහිවෙලා. එතුමා තුන්වන අදියරටත් අද දින ඉදලා ඒ භූමියේ වැඩ පටන්ගෙන තියෙනවා. නමුත් ඔබතුමාට දැන් මම මේ සභාවාර හතරවෙනි සැරේට විතර කතා කරන්නෙ. ඒක බලන්න තව වෙනතුරු නිලධාරියෙක් ගියේ නැහැ. මම ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හැටියට ඒ ගැන ඇත්තටම මට කළකිරීමක් ඇතිවෙලා තියෙනවා. මොකද අපේ සභාවෙ පාලක පක්ෂයේ සභාපතිතුමා ඉදගෙන අපට මොනම දෙයක්වත් කරගන්න බැහැ කියල අපේ ජනතාව දොස් කියනවා. මොකද ඒ දේවල් කරන්නෙ ඒ අයට තියෙන මුදලටද? ඒ අයට තියෙන දේශපාලන හයියකටද? කියල මට දැනගන්න ඕන. මොකද තව වෙනකම් මොනම දෙයක්වත් කළේ නැති නිසා. සභාවෙ ලේකම්තුමිය ඉන්නවා. කිසිම නිලධාරියෙක්

ගිහිල්ල ඒ ගැන හොයල බලන්නෙ නැහැ. ඇයිද එහෙම කරන්නෙ? පොදු නාන ලිඳ තියෙන ඉඩම අයිති අනිත් අය තේ පැල ඉන්දන්න සුද්ද කරල තියෙනවා. ඒ වගේ දේවල් කරන කොට, ගමේ ඉන්න, ප්‍රදේශයේ ඉන්න මන්ත්‍රීවරයා වශයෙන් අපි දැඩි අපහසුතාවයකට ලක්වෙලා ඉන්නවා. ඒ ගැන මම මේ හතරවන සභාවාරෙ කතා කරන්නෙ. දැන් මැතිවරණ සමයත් අවසන් නිසා, ඔබතුමා මින් ඉදිරියටවත්, ඒ ගැන වැඩි අවධානයක් යොමු කරලා මොනව හරි කරන්න පුලුවන් දෙයක් සභාවෙන් කරන්න. නැත්නම් නීති මාර්ගෙන් පොලිසිය දැනුවත් කරන්න. නැත්නම් නඩුවක් දාන්න. මොනව හරි දෙයක් කරන්න. ලක්ෂ ගණනක පොදු නාන ලිඳක් කඩල බිදල විනාශ කරල තියෙන්නෙ. අපේ ගමේ සම්පතක් ඒක. ඒ නිසා ඔබතුමා ඒ ගැන විශේෂ අවදානයක් යොමු කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ඔබතුමා ඌරල ප්‍රදේශයට වීදි ලාම්පු තුනක් ලබා දුන්නා. ඒ ගැනත් බෙහෙවින්ම ස්තූති වන්ත වෙනවා. ඒ වගේම දැන් සියලුම මාර්ගවල තියෙන වීදි ලාම්පු අක්‍රිය තත්වයේ පවතිනවා. ඒවත් ඉතා ඉක්මනින් පිළිසකර කරල දෙන්න කියලා ඉල්ලීමත් කරමින්, මාගේ බාප්පාගේ මළගමට සම්බන්ධ වුන ගරු සභාපතිතුමන්,උප සභාපතිතුමන්, විපක්ෂ නායකතුමන් ඇතුලු සියලුම මන්ත්‍රීතුමන්ලාටත්, මන්ත්‍රීතුමියන්ලාටත් මම මේ අවස්ථාවේ ස්තූතිය ප්‍රකාශ කරනවා. ගරු සභාපතිතුමනි, ඌරල පොදු ලිදේ කාරණාව ගැනනම් ඉක්මනින් හොයල බලල මොනව හරි කටයුත්තක් කරන්න. මොකද තුන්වෙනි අධියරටත් ඒ නිවෙස් හිමියා ඊයෙ දින සිට වැඩ පටන් අරගෙන තියෙන නිසා ඔබතුමාගෙ දැඩි අවදානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. බෙහෙවින්ම ස්තූතියි.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ප්‍රථමයෙන්ම අපේ ආසන සංවිධායක ඉසුරු දොඩංගොඩ මැතිතුමාටත්, ඒ වගේම සම්පත් අතුකෝරල මැතිතුමාටත්, උනුසුම් සුබපැතුම් එක්කරමින්, ගරු සභාපතිතුමනි, ඔබතුමාට කියන්න පුංචි දෙයක් තියෙනවා. ගරු සභාපතිතුමනි කොට්ඨාසෙ මන්ත්‍රීවරයෙක් සිටියදී ගරු සභාපතිතුමා විසින් හෝමදොල ක්‍රීඩා පිටියෙ තිබුන ABC ගල්ටික දන්නෙම නැතුව ගිහින් හොරට පැටෙව්වා. ඒක නිසා ගරු සභාපතිතුමනි, ඒ කොන්ත්‍රාත් සමාගමට කියලා අපෙන් අහල තමයි. ඒ ගල්ටික ක්‍රීඩා පිටියට දැම්මෙ. ක්‍රීඩා පිටිය සකස් කරන කොට අපි නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමාට කියලා වත්තත් එක්ක කතා කරල නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමාගෙ මුදලින් තමයි අපි ඒ ක්‍රීඩා පිටිය හැදුවෙ. වත්තට තමයි දැනටත් ක්‍රීඩා පිටිය තියෙන්නෙ. ඒ නිසා ඒ ක්‍රීඩා පිටියට දාපු ABC ගල්ටික ක්‍රීඩා පිටිය මැද තියෙන කොට, ඔබතුමා විසින් අපේ කොට්ඨාසයකට, මන්ත්‍රීවරයෙකුට රුපියල් ලක්ෂය බැගින් දුන්නා. ඒ දීපු මුදලින් රුපියල් 15000 ක් ඉතිරිවෙලා තිබ්ලා මම ඒ ඉතිරි වුන මුදලින් තමයි ක්‍රීඩා පිටියෙ තිබුන ගල්ටික පැත්තකට දාගත්තෙ. පාරවල්වලට අඩු පුරව ගන්න. නමුත් මට ආරංචි වෙන කොටත්, ගරු සභාපතිතුමනි, ඔබතුමා ABC ගල් කියුබ් හයක් හතක් විතර උඩුගමට ගෙනැල්ලා. නමුත් අපට කියන්න ලැජ්ජයි. ගරු සභාපතිතුමනි, අපේ සභාවක් තියෙද්දිත්, කොට්ඨාසෙ අපේ මන්ත්‍රීවරයෙක් සිටිද්දිත් සභාපතිතුමා විසින් එතනට වාහන දෙකක් දාලා ස්කැවේටරයක් දාලා හොරා ගල්ටික ගේනවා. අපේ ගම්වල මිනිස්සු දීපු ඡන්දෙන් මන්ත්‍රීවරයා විදිහට අපි මෙතනට කොට්ඨාසයක් නියොජනය කරල ඇවිල්ලා ඉන්නෙ. ඒ නිසා ඔබතුමාගෙ යුතුකමක් වගකීමක් තියෙනවා. ඒක ගෙනාවත් කමක් නැහැ. ඒක ගේනකොට කතා කරල කියන්න යුතුකමක් තියෙනවා. මම උප සභාපතිතුමාටත් කිව්වා. කොට්ඨාසෙ මන්ත්‍රීවරයට මෙන්න සමන් අපි මේ ගල්ටික ගේනවා. මොකද කියන්නෙ කමක් නැහැ නේද කියල අහන සිරිතක් තියෙනවා. ගල් කියුබ් හය හතක් ගේනකම් දන්නෙම නැහැ. අපි එතනට එනකොට සභාපතිතුමා ගල්ටික පටවනවා. මම සභාපතිතුමාට කතා කරල කිව්වා. අපෙන් මිනිස්සු අහනවා මෙලෝ වැඩක් කරන්නෙ නැහැ. නමුත් ක්‍රීඩා පිටිය හදල දෙන්නවත් අපට එහෙම දුන්නෙ නැහැ. මට ලබාදීපු ප්‍රතිපාදනවලින් ඉතිරි වුන රුපියල් 15000 න් තමයි වැඩේ කළේ. කොට්ඨාසෙ මන්ත්‍රීවරයට එතනදි ඔබතුමා ලොකු අසාධාරණයක් කළා. අපි දන්නෙ නැතුව මෙතනින් සේවකයො යවලා ගල්ටික ගේනවා. ඒ සම්බන්ධව දැඩි කණගාටුවට පත්වෙනවා. මොකද ඒ වගේ දෙයක් කොට්ඨාසෙ මන්ත්‍රීවරයෙක් සිටිද්දි

ඒ කොට්ඨාසයේ ඉන්න මන්ත්‍රීවරයා පක්ෂ බේදයකින් තොරව, UNP මන්ත්‍රීවරයෙක් වෙන්න පුලුවන්, JVP වෙන්න පුලුවන් ඒ මන්ත්‍රීවරයගෙ ගරුත්වයට හානියක් වෙන විදිහට වැඩක් කරනවානම් අපි ඒකට දැඩි කණගාටුව පළ කරනවා. ඒ නිසා අපට මේ වෙලාවෙ ආණ්ඩුවක් ඇවිල්ල තියෙනවා. එතනින් කරන්න ඕන දේ අපට පක්ෂ බේදයකින් තොරව සියලු දෙනාත් එක්ක සහයෝගෙන් වැඩ කටයුතු කරමු. ඒ නිසා ඉදිරියට වැඩක් කරනවනම් කොට්ඨාසෙ මන්ත්‍රීවරයට හානියක් නොවන විදිහට, ගරුත්වය රැකෙන විදිහට ඔබතුමා ඒ වැඩකටයුතු කරන්න කියන ගෞරවණීය ඉල්ලීම කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අපට සතුටු වෙන්න පුලුවන් ඒ කියන්නෙ ඔබතුමාලට දැන් විශිෂ්ඨ ජයග්‍රහනයක් ලබා දීලා තියෙනවා. ඒ වගේම අද ඔබතුමාල අපට හොඳ සංග්‍රහයක් කළා. නමුත් ගරු සභාපතිතුමනි, මෙන්න මේ දේවල් ටික අපට කෙරෙන්න ඕන. ඒ මිනිස්සු ඔබතුමාලට ජයග්‍රහනය ලබා දුන්නෙ මෙන්න මේ ආකාරයේ සියලුම දේ ලබා දෙයි කියල හිතලා. ඒක තමයි සභාපතිතුමනි අර පහුගිය මාසවල තිබුන විදුලි බිල අඩු කිරීම සිදු වුනාද ? ඒවා සිදුවෙන්න ඕන. ඊලගට ගරු සභාපතිතුමනි, එම්සීසී ගිවිසුම ඒක ඉරල දානවද මොනවද කරන්නෙ. ඇස්පා සෝපා වගේ ගිවිසුම් ටිකට මොකක්ද කරන්නෙ? කොළඹ ජැටියට මොකක්ද කරන්නෙ? විකුණනවද? නැත්නම් ඒ වගේ ගිවිසුම් ක්‍රියාත්මක කරනවද? නැද්ද? කියලා අනිවාර්යයෙන්ම අපට දැනගන්න ඕන. එම නිසා ගරු සභාපතිතුමනි, මම හිතන්නෙ ඒ ටික අපට කරල දෙයි. ඒ වගේම තමයි, ගරු සභාපතිතුමනි, මම ඊට එහා කතා කරන්න යන්නෙ නැහැ. අපි සතුටු වෙන්නෙ අන්න ඒව කළොත් තමයි.

ගරු සභාපතිතුමනි, අපේ කුඹුරුහේන කණිෂ්ඨ විද්‍යාලයට දැනට ළමයින් අලුතෙනුත් ඇවිල්ල ඉන්නවා. ළමයි නව දෙනෙක් ඉන්නවා. ඒක වැසීයාමේ තර්ජනයට ලක්වුන පාසලක්. ඒක කොහොම හරි නගා සිටුවීම තමයි අපේ බලාපොරොත්තුව. පාසලට පිරිමි ගුරුවරු දෙන්නෙක් තමයි ඉන්නෙ. අපට ගැහැනු ගුරුතුමියක් තමයි අවශ්‍ය වෙන්නෙ. පාසලේ ලොකු ගැහැනු ළමයි ඉන්නෙ. හදිසියෙ කලන්තයක් ගියත් ඔසවන්නවත් එහෙම මොකුත් කරන්න බැහැ. එම නිසා ගරු සභාපතිතුමනි, ඒ බව කලාප කාර්යාලයට දැනුම් දීලා, ඒ සම්බන්ධව ඔබතුමා කටයුතු කරන්න කියලා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, වීදි ලාම්පු සම්බන්ධයෙන් අපි යෝජනා දුන්නා. නමුත් ඒක තවම කෙරුනෙ නැහැ. අපේ පියල් මන්ත්‍රීතුමත් දන්නවා. අසෝක මහත්මයගෙ කඩේ ඉස්සරහ වංගුවක් සහිත පාලමක් තියෙනවා. එතනට වීදි ලාම්පුවක් ලබා දෙන්න කියලා ඉල්ලනවා. මොකද එතන ඉතාම අනතුරුදායකයි. ඒ වගේම ගරු සභාපතිතුමනි, මත්ද්‍රව්‍ය ප්‍රශ්නය නම් දැන් ගෙයින් ගෙට තියෙනවා. ඒ ප්‍රශ්නය කොහොම හරි නවත්තලා දෙන්න. ඒ කියන්නෙ දැන් ස්වයං රැකියාවක් වශයෙන් තමයි තියෙන්නෙ. ඒ කියන්නෙ අවුරුදු 13 නේ ඉදලම දරුවො දැන් මත්ද්‍රව්‍ය ජාවාරම පටන් අරගෙන.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, ඔබතුමාලට තියෙන කාපට් කිලෝමීටර් ලක්ෂෙන් ඔබතුමා අපේ කුඹුරුහේන පාරටත් ලබා දීලා තියෙනවා. අපි ඒක අගය කරනවා. ඒ වගේම තමයි අපේ සම්පත් මහත්තයත් දියවර ගම්මානෙදි කතා කරල තිබුනා. මාසයක් ඇතුලත පාර කාපට් කරල දෙනවයි කියලා. එහෙම හදල දුන්නොත් ඇත්තටම අපි සතුටු වෙනවා. ඒ ගැනත් ඔබතුමාට ඉතා ගෞරවයෙන් මම නැවතත් මතක් කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, ඔබතුමන්ලා ලැබූ ජයග්‍රහනය ගැන අපි සතුටු වෙනවා. මෙන්න මේ ආකාරයේ සියලු දේ අපේ ගම් වාසීන්ට ලබා දෙන්න කියල ඉල්ලමින්, සියලු දෙනාටම ස්තූතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. අද ඉතාමත්ම ඓතිහාසික සභාවාරයක්. මුලින්ම මම වචන දෙකකින් කියන්නම්. අපි දිනුම් එච්චරයි මම කියන්නෙ. එතනින් එහාට මම කතා කරන්නෙ නැහැ. දැන් අපි දිනල තියෙන්නෙ. ඉදිරි අවුරුදු පහ තුල අපි රට දිනවන්න සූදානම් වෙන්නෙ. විපක්ෂයේ සියලු මන්ත්‍රීතුමන්ලාට අපි ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. අපේ ජයග්‍රහනය වෙනුවෙන්, අපිත් එක්ක අර සංග්‍රහය භුක්ති වින්දා. අපි බොහොම ආදරයෙන් අපි මොන දේශපාලන මතය දැරුවත්, අපි සහෝදරයො විදිහට ඒවගේම අපි එක හිතවතුන් විදිහට මේ සභාවෙ කටයුතු කරගෙන යනවා. මට මෙන්න මේ කාරනාව කියන්න ඕන. මැතිවරණ කාලේ අපි ආණ්ඩු පක්‍ෂය විදිහට දේශපාලන නීති ඒ විදිහටම රකින කොට අපි දැක්ක දුර්වලතාවයක් මැතිවරණ කොමසාරිස්තුමා පැහැදිලිවම කිව්වා. පූජනීය ස්ථානවල මැතිවරණ ප්‍රචාරණ කටයුතු කරන්න එපා කියලා. මට ලිඛිතව සාක්ෂි එක්ක පෙන්නන්න පුලුවන්. එක්සත් ජාතික පක්ෂයේ වජිර අබේවර්ධන හිටපු අපේක්‍ෂකතුමා උඩුගම සාසනාලංකාරාමයේ කිරිපිඩු පූජාවක් කියලා ගෙනැල්ලා ඉතාමත් නින්දිත විදිහට මැතිවරණ ව්‍යාපාරය ක්‍රියාත්මක කළා. මාධ්‍යවේදීන් අද ඇවිල්ල නැහැ. මොකද ඒක සදහන් වෙන්න ඕන. දිගින් දිගටම මම පොලීසිය දැනුවත් කළා. නමුත් පොලීසිය අසරණ වුනා. ඒ වගේම එතන හදල තිබුන පාලම විවෘත්ත කරන්න සියලු කටයුතු සූදානම් කරල තිබුනා. ඒ පාලම පොලිසිය මැදිහත්වෙලා විවෘත්ත කිරීම නතර කළා. විවෘත්ත කරන්න සුද්ද කරලා පිඩලි අල්ලලා සියලු කටයුතු ඉතා හදිසියෙ කරල තිබුනා. මෙන්න මේ වගේ නින්දිත ආකාරයෙන් එක්සත් ජාතික පක්‍ෂය හැසිරීම පිළිබඳව මේ අවස්ථාවෙදි මගේ කණගාටුව පළ කරන්න අවශ්‍යතාවයක් නැහැ. මොකද ජනතාව නියම පිළිතුර දුන්නා. ගාල්ලෙන් විතරක් නෙවෙයි. මුලු ලංකාවෙන්ම එක්සත් ජාතික පක්‍ෂයට, ජනතා විමුක්ති පෙරමුණටත් වඩා පහළට දාලා නියම පිළිතුර ලබා දුන්නා. ඒ පිළිබඳව මම සතුටු වෙන්නෙ නැහැ. නමුත් මේ පිළිබඳව මතක් කරන්න ඕන.

ඊට පස්සෙ ගරු සභාපතිතුමනි, ඔබතුමා නිතරම කියන දෙයක් තමයි මම සභාපති මම සභාපති කියන එක. ගරු සභාපතිතුමනි, සමාවෙන්න මම මේ දේ කියනවට මම මේ මතක් කරන්නෙ. කොහොමටවත් ඔබතුමා කලින් සභාපතිවරු හා සමාන වෙන්නෙ නැහැ. හේතුව සභාපති ධූරය පත්කරන්නෙ පක්ෂයෙන්. මොකද සභාපතිතුමා වශයෙන් ඔබතුමා වගේම අපිත් කොට්ඨාසයක් දිනලා ආපු මන්ත්‍රීවරු. ඔබතුමා මුලු නාගොඩ ප්‍රාදේශීය සභාවෙම ඡන්දය ඉල්ලලා, සභාපතිවරයා බවට පත්වුනා නම්, අපිට පිළිගන්න පුලුවන්. ඔබතුමා මුලු සභාවෙම ජනතා නියෝජිතයා කියලා. ඔබතුමා මන්ත්‍රී ධූරයට පත්වුන විදිහටම තමයි අපි සියලු දෙනත් මන්ත්‍රී ධූරයට පත් වෙන්නෙ. එතකොට ඔබතුමා සභාපති විදිහට ඔබතුමාට ලැබෙන බලතල නීත්‍යානුකූලව ලැබෙන්න පුලුවන්. නමුත් සමන් මන්ත්‍රීතුමා කියපු විදිහට ඔබතුමාට යුතුකමක් තියෙනවා. කලින් හිටපු සභාපතිවරුන්ට වඩා මන්ත්‍රීවරුත් එක්ක එකතුවෙල වැඩ කරන්න. මන්ත්‍රීවරු දැනුවත් කරලා වැඩ කරන්න යුතුකමක් තියෙනවා. පහුගිය දේවල් මතක් කරන්න ඕන නැහැ. අර එලවලු බෙදාදීම්, කොරෝනා සමයේ හැසිරිච්ච විදිහ මතක් කරන්න අවශ්‍යතාවයක් නැහැ. තනි තීරණ අරගන්න ඔබතුමාට සදාචාරාත්මක අයිතියක් නැහැ කියන එක මම මතක් කරනවා. ඔබතුමා වගේම අපිත් පත්වෙලා ආපු නිසා, ඔබතුමා පත්වෙලා තියෙන්නෙත් මුලු සභාවෙන්ම නෙවෙයි නාගොඩ කොට්ඨාසයකින්. අපිත් පත්වෙලා තියෙන්නෙ ඒ වගේ කොට්ඨාසයකින් කියන එක මම විශේෂයෙන් මතක් කරන්න ඕන. ඒක මේ ආරවුලක් ඇති කර ගන්න නෙවෙයි කිව්වෙ. අපි හදිස්සියෙන් තමයි ඔබතුමාගෙ ඒ වගේ දේවල් දකින්නෙ. නමුත් මම දකින්නෙ ඔබතුමා එක එක්කෙනාට ඕන විදිහට ක්‍රියාත්මක වෙන්න ගිහිල්ල තමයි ඇනගෙන තියෙන්නෙ. ඒ නිසා ඔබතුමා හිතලා බලලා හරි දේ කරන්න කියන එක ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමාට සහයෝගය දෙන්න අපි ඕන වෙලාවක සූදානම්. අපි කිසිම වෙලාවක කඩාකප්පල් කරන්න එහෙම නැත්නම් මේ වැඩකටයුතු විනාශ කරන්න අපි කිසිසේත් බලාපොරොත්තු වෙන්නෙ නැහැ. පක්‍ෂයක් විදිහට, කණ්ඩායමක් විදිහට ඔබතුමාත් එක්ක සිට ගන්න අපි සූදානම්.

ඒ වගේම මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ උඩුගම, නාගොඩ වශයෙන් ප්‍රාදේශීය සභාවෙ බෙදීම් ඇති කරගන්න එපා. ගරු සමන් විතානගේ මන්ත්‍රීතුමනි, ගරු සභාපතිතුමනි, උඩුගම හිනිදුම කියලා දෙයක් නැහැ. නාගොඩ ප්‍රාදේශීය සභාවෙ අපිට මේ දෙකම එකයි. අපි සන්තෝෂ වෙන්න ඕන. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විදිහට නාගොඩ ප්‍රාදේශීය සභාවට මේ වෙනකොට අපිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙදෙනෙක් පත්වෙලා ඉන්නවා. මම හිතන්නෙ කිසිම ප්‍රාදේශීය සභාවකට නැති අවස්ථාවක්. මොකද අපි ආසන දෙකක් නියෝජනය කරද්දි ඉතාමත්ම දක්ෂ ඉතාමත්ම ඉහලින් පත්වුන මන්ත්‍රීවරු දෙන්නෙක් ඉන්නවා. සම්පත් අතුකෝරල මැතිතුමා, ඉසුරු දොඩංගොඩ මැතිතුමා. ඔබතුමා සම්පත් අතුකෝරල මැතිතුමා ගැන විතරයි සඳහන් කළේ. ඉසුරු දොඩංගොඩ මැතිතුමා සහ සම්පත් අතුකෝරල මැතිතුමන්ලට මගේ සුබ ප්‍රාර්ථනය සහ අපි දීපු ශක්තියත් එක්ක ඔබ තමුන්නාන්සෙල දීපු ශක්තියත් එක්ක ප්‍රණාමය පුදකරන ගමන්, අපේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ශක්තිමත් වැඩ කොටසක් කරන්න ඉදිරියෙදි පුලුවන් කම ලැබෙනවා. ඒ පිළිබඳව පළවෙනි වෙඩි මුරය තියන ගමන් දැන් ආණ්ඩුව අපේ. ජනාධිපතිවරයා, අපේ අගමැතිවරයා, අපට පළාත් සභාව විතරයි ගන්න තියෙන්නෙ. පළාත් සභාව ගත්තට පස්සෙ අපට ප්‍රතිපාදන ලබා ගෙන, මීටත් වැඩිය හොඳින් මේ වැඩකටයුතු කරගෙන යන්න පුලුවන්. ඒ වගේම ඔබතුමා නිතරම මතක තියාගන්න ඕන නාගොඩ ප්‍රාදේශීය සභාවෙ පොහොට්ටුවෙ අපි 15 දෙනා එකට ඉන්නවා. ඒ පිළිබඳවත් මතක් කරන ගමන්, සියලු දෙනාට ජයෙන් ජයම වේවා කියමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා**

ගරු සභාපතිතුමනි මම නැගීසිටියේ උනන්විටිය සති පොල ගැන වචනයක් කතා කරන්න. දැන් ඒ සති පොල කොරෝනා ව්‍යසනයෙන් පස්සෙ ඉතාම සුලු වෙළෙන්දන් ප්‍රමාණයක් තමයි පැමිනෙන්නෙ. එම නිසා ජනතාවත් ඉතා සුලු ප්‍රමාණයක් පැමිනෙන්නෙ. ඒ නිසා පොල අභාවයට යන්න නොදී ආරක්ෂා කර ගන්න හැකි ක්‍රියාමාර්ගයක් ගන්න කියල සභාපතිතුමාට මම යෝජනා කරනවා. ඒ වගේම එහි ජලය නොමැතිකමින් අපවිත්‍රව පවතිනවා. දැනටත් මේ දවස්වල වැසි ජලය නිසා මඩ ගතියක් ඇති වෙලා තියෙනවා. පොල සුද්ද කිරීමෙදිත් ලොකු කසල විතරයි අයින් කරන්නෙ. ඒකත් ට්‍රාන්ස් පෝමරය ලග ගොඩ ගහල තියෙනවා. ඒකත් හැකි පමණ ඉක්මනින් අයින් කරන්න කියල මම යෝජනා කරනවා.

ඒ වගේම උනන්විටියට තිබුන සුසාන භූමිය කැලෑ වෙලා. දැන් ඒ සුසාන භූමියට යාබද ඉඩම්වල අය පොඩ්ඩ පොඩ්ඩ අල්ලගෙන යනවා. එයත් රැක ගැනීමට මේ අවස්ථාවෙදි ඔබතුමාගෙ සහය පතනවා. ඒ වගේම උනන්විටියට, බුදපනාගම ප්‍රදේශයට අපි කලින් යෝජනා කරගත් පරිදි පානීය ජලය තවම ලැබී නැහැ. පහුගිය ව්‍යසනයෙදි අපි විශාල වැයමක් දරලා, ජනතාවගෙ වියදමින්, පානීය ජලය ලබා දෙන්න මමත් ඒකට දායක වුනා. තවමත් ඒ අයට ජල උල්පතක් නැහැ. ඒ පිළිබඳව දැන් අර අද තියෙන ව්‍යපෘතියෙදි උනන්විටිය ප්‍රදේශයට ප්‍රමුඛස්ථානය ලබා දෙන හැටියට මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම උනන්විටියට තියෙන නිල සෙවන අපට අහිමි වෙලා තියෙනවා. ඒ වගේම ඉඩම් නැතිකම නිසා, අපට උනන්විටිය තැපැල් කන්තෝරුව පවත්වාගෙන යාමටත් තැනක් නැහැ. දැන් උනන්විටියෙ පොඩි ඉඩකඩක තමයි පවත්වගෙන යන්නෙ. ඒ ජනතාව ඉතාම අපහසුවට ලක්වෙලා තියෙනවා. ඒ වගේම මම යෝජනා කරනවා. සති පොලේ අකුරුගොඩ මහත්තයට අයිති පර්චස් 32 කේ වපසරිය සභාවට පවරගෙන, එතන නිල සෙවන ගොඩනැගිල්ලක් සාදා දෙන ලෙසත්, එවිට අපට තැපැල් කන්තෝරුවත් ඒ ස්ථානයේ පවත්වාගෙන යාමටත් පුලුවන් වෙන නිසා එය මා යෝජනා කරනවා.

ඒ වගේම අපට පසුගිය කාලයේදී කාපට් කිලෝමීටර් ලක්ෂයක් ලබා දීමට අපට කැමැත්ත පළ කරලා තියෙනවා. අපගේ හිටපු දකුණු පළාත් මන්ත්‍රී පත්මසිරි ද සිල්වා මැතිතුමා, හෙන්රි දිසානායක මාවතට කිලෝමීටර් දෙකක් ලබා දීම පිළිබඳව එතුමාට මම මේ අවස්ථාවෙදි ස්තුති වන්ත වෙනවා. ඒ වගේම මම මේ අවස්ථාවක් කර ගන්නවා. අපගේ ජනාධිපතිතුමාටත්, අග්‍රාමාත්‍යතුමාටත්, මන්ත්‍රී මණ්ඩලයටත්,

විශේෂයෙන්ම අපගේ ආසනය නියෝජනය කළ සම්පත් අතුකෝරාල මැතිතුමාටත් සෞභාග්‍යයේ දැක්ම කරගෙන යාමට ධෛර්යය ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනය කරමින් මා මෙයින් කතාව අවසන් කරනවා.

**ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ගෙන් අවසරයි. මේ අවස්ථාවෙදි ලැබූ ජයග්‍රහනය පිළිබඳව හිනිදුම ආසනයේ අපේ ප්‍රධාන සංවිධායකතුමා සම්පත් අතුකෝරල මැතිතුමාට, ඒ වගේම ඉසුරු දොඩංගොඩ මන්ත්‍රීතුමා, ගාලු දිසාවේ අපේ නායකතුමානන් රමේෂ් පතිරණ මැතිතුමන්, ඒ වගේම මොහාන් පී ද සිල්වා මැතිතුමන් යන සියලු දෙනා මේ අවස්ථාවෙදි සිහිපත් කරමින්, ඒ අය ලැබූ ජයග්‍රහනය පිළිබඳ අපි අතිශයින්ම සන්තෝෂයට පත්වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවෙදි සඳහන් කරන්න ඕන. මාර්ග පද්ධතිය පිළිබඳ කටයුතු කිරීම තුල යා නොහැකිම පාරවල් පිළිබඳව ප්‍රමුඛතාවය දීලා ඒ පාරවල් කාපට් කිරීම සඳහා කටයුතු සකස් කරලා දෙන්න කියලා ගෞරවණීය ඉල්ලීමක් කරනවා. මොකද මේ දිනවල බෙම්බඩ ප්‍රදේශයේ පයින්වත් යා නොහැකි තත්වයට ඒ පාර පත්වෙලා තියෙනවා. විශේෂයෙන්ම මේ දිනවල පාසල් පටන් ගැනීම නිසා ළමයින්ට පාසල් යනකොට සපත්තු දෙකවත් දාගෙන යන්න බැරි තත්වෙට පත්වෙලා තිබෙනවා. මෙගොඩහ ගොඩට ඇවිල්ල තමයි සපත්තු දා ගැනීම කරන්නෙත්. මහා මඩවලවල් පයින්වත් යන්න බැහැ. පසුගිය දවස්වල මම පයින් යන්න ගියා. කොහොමටවත් ඒ පැත්තෙන් යන්න බැහැ. නැවත හැරිල ආවා. ඒ වුනාට දෛනික වැඩකටයුතු සඳහා ඒ ජනතාව මේ පාර භාවිතා කිරීමේදී විශාල අපහසුතාවකට පත්වෙලා තියෙනවා. විශේෂයෙන්ම ගල් කොරියෙ වාහන ගම් ගන්නා නිසා විශාල වශයෙන් මඩ වීම සිදු වෙනවා. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ගෞරවණීය ලෙස ඉල්ලීමක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ දවස්වල විදුලිය පිළිබඳ කතා කරද්දි ඇත්තටම සමහර තැන්වලට විදුලි පහන් අවශ්‍ය වී තිබෙනවා. ඒ වුනාට ඒ සඳහා ඔබතුමාට අපි දන්නවා පසුගිය කාලය තුලදි ඒ කටයුතු කරන්න අපහසුතාවයන් රැසක් තිබුනා. මේ දිනවල ඒ පිළිබඳව සොයා බලා කටයුතු කිරීමේ හැකියාවක් තියෙනවානම් සියලුම කොට්ඨාසවලට ඒ අවශ්‍ය තැන්වලට විදුලිය ලබා දීමේ කටයුත්ත සම්පාදනය කරන්න කියල ඉල්ලීමක් කරනවා. ගරු සභාපතිතුමනි, නාගොඩ වත්තෙ වතු යටිතල පහසුකම් යටතේ රුපියල් ලක්ෂ 10 ක මුදලක් පාස්වෙලා ඇවිල්ලා තිබුනා. ආණ්ඩුකාරතුමා යටතේ ඒ පිළිබඳව අපි සාකච්ඡා කළා පමණයි. පසුගිය දවස්වල වැඩ වැඩිවීම නිසා මම හිතන්නෙ ඒ පිළිබඳව පොඩ්ඩක් අතපසු වීමක් සිදුවෙන්න ඇති ඒ පිළිබඳව අවධානය යොමු කරලා ඒ ලබන්න තියෙන වරප්‍රසාදය ලබාදීමට කටයුතු සලසා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එසේ සිහිපත් කරමින් සියලු දෙනාට සුභ දවසක් තෙරුවන් සරණයි කියල ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංක මහතා**

සභාපතිතුමා ඇතුළු සමස්ථ සභාවෙන් අවසරයි. ප්‍රථමයෙන් අග්‍රාමාත්‍ය තනතුරේ දිව්රුම් දුන් අපේ හදවතේ ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට මුලින්ම සුභපතන ගමන්, ගරු සභාපතිතුමනි, වීදි ලාම්පු පිළිබඳව ප්‍රශ්නයක් මතු කළා. මම හිතන්නෙ මම මේ සභාවට ආව තෙක් මගේ පාරවල් දෙකක් තියෙනවා තව වෙනතුරු ඒ පාරවල් දෙකට වීදි ලාම්පුවක් හදා ගන්න බැරිවෙලා තියෙනවා. මම හිතන්නෙ ඒ පහුගිය කාලෙ තිබුනු මූල්‍යමය සහ අපේ සේවකයන් අඩුවීමත් ඒක්ක. අපි දන්න විදිහට ඔබතුමාට චෝදනා කරන්නෙ නැහැ. අපි මෙතන ඉන්න මිනිස්සු හැටියට අපි දන්නවා. ඒ අඩුපාඩු තියෙද්දි සියලු දේවල් සම්පූර්ණ කරන්න බැහැ. නමුත් සභාපතිතුමනි, ඉදිරියෙදි ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා ඒ සේවකයන් බඳව ගන්න හරි ඒ මුදල් වෙන් කරගෙන ඒ අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි, අපේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. කුඹුරුහේන පාරත් කාපට් කරන්න කියලා. ගරු මන්ත්‍රීතුමා වෙලේ ඉන්න කොට තමයි මම ඒ මහත්වරුත් එක්ක පාර මැනගෙන ගියේ. ඒ ගැනත්

මතක් කරමින් අපේ හිනිදුම ආසනයේ ප්‍රධාන සංවිධායකතුමා සම්පත් අතුකෝරල මැතිතුමා හට හිනිදුම ආසනය, ආසනයක් හැටියට ගත්තම ආසනේ මනුස්සයට හොදටම සලකපු ආසනය තමයි හිනිදුම ආසනය. 50000 ක් ඡන්ද පාවිච්චි වෙනකොට එතුමට හතලිස් දහස් ගණනක් මනාපය පළ කරලා තියෙනවා. ගාලු දිස්ත්‍රික්කෙ ජනතාව හැටියට එතුමන්හට 128331 ක් මනාප ලබා දීල ලැයිස්තුවේ දෙවනියා හැටියට එතුමා පත්කළා. ඒ වගේම තමයි අපේ තරුණ නායකත්වයක් දෙන අපේ බද්දෙගම ආසනයේ සංවිධායකතුමා ඉසුරු දොඩංගොඩ මැතිතුමාටත්, සම්පත් අතුකෝරල මැතිතුමාටත් සුභ පතන්න මේක අවස්ථාවක් කර ගන්නවා. ඒ වගේම අපට පුලුවන් වුනා. බොහොම නිහතමානී විදිහට ජයග්‍රහනය සමරන්න. මගේ කොට්ඨාසෙනම් රතිඤ්ඤයක්වත් පත්තු කරන්න කටයුතු කළේ නැහැ. ඒ වගේ දේවල් අපි කරන්න පෙළඹෙන්නෙ නැහැ. කෙනෙක් ජයග්‍රහනය කරන කොට තව පිරිසක් පරාජය වෙනවා. අපි බොහොම සාමකාමී විදිහට කිරි බත් ටිකක් උයාගෙන කාලා ජයග්‍රහණය සැමරුවා. ඒ ගැනත් සිහිපත් කරමින් සියලු දෙනාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

සුභ දවසක් සියලු දෙනාටම. ගරු සභාපතිතුමනි, අපේ විහාරස්ථානයේ විහාරාධිපතිව වැඩ විසූ කල්‍යානතිස්ස අපේ ලොකු හාමුදුරුවන් වහන්සේ අවුරුදු 99 යි මාස 11 යි දින ගණනක් ආයු වළදා අපවත් වුනා. ආදාහන උත්සවය අද. ඒ නිසා මගේ මේ කතාවෙ අවසානයෙන් පස්සෙ, වෙලාසනින් බැහැර යන්න අවසර පතනවා. මම විශේෂයෙන්ම මේ අවස්ථාවෙ නැගී සිටියේ මැතිවරණයෙන් ලබපු ජයග්‍රහනය පිළිබඳව කතා කරන්න නෙවෙයි. නාගොඩ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන සම්පත් අතුකෝරල මැතිතුමත් ඉසුරු දොඩංගොඩ මැතිතුමත් කියන්නෙ දෙන්නෙක් නෙවෙයි. එක්කෙනෙක්. මේ දෙන්නගෙ පාර්ලිමේන්තු ගමන නිසා මම හිතන්නෙ අපේ සභාවට විශාල ශක්තියක් වෙයි. අපි මේ මැතිවරණය දිහා බැලුවාම පේන්නෙ අපි කවුරුත් ජයග්‍රහනය කරල තියෙනවා. බලන්න පරිසර හානි අවමයි. එක තැනකවත් ඉටි කොලයක් ඇදල තිබුනෙ නැහැ. බැනර් කටවුට් තිබුනෙ නැහැ. සමහර තැන්වල මම දැක්ක සහබන්දු මහත්තයගේ කොට්ඨාසෙ කාර්යාලයක් දාල තිබුනා. වෙනද ඒ බිත්තිය පුරාම අකුරු ලියල පාට කරල අමුතුම ලස්සනක් කර ගන්නවා. මේ සැරේ ඒවා කිසිවක් නැහැ. අපි කාර්යාල දැම්මෙම නැහැ. ඒ කාර්යාලය ඇතුලෙ පක්ෂයේ අපේක්ෂකයගෙ අංකයක් ප්‍රදර්ශනය කරන්න බැරිනම්, මොකටද කාර්යාලයක් දාලා. ඒ නිසා ඒ ප්‍රතිපත්ති උඩ අපි සියලු දෙනාම කාර්යාල ප්‍රතික්ෂේප කළා. හිනිදුම බල ප්‍රදේශයෙත් එහෙමයි. සමහර තැන්වල, බද්දෙගම පැත්තෙ පාරෙ එනකොට මම දැක්කා කාර්යාල දාල තිබුනා. ඒවත් ඉටි කොල හා අනිකුත් පරිසර හානි වෙන දේවල්වලින් තොරව තමයි කරල තිබුනෙ. අපි දේශපාලන වේදිකාවෙත් එහෙමයි. වෙනද වගේ බැන අඩගහ ගත්තෙ නැහැ. ඒ ගෙදර එක්කෙනාට මේ ගෙදර එක්කෙනා බැන්නෙ නැහැ. ඒ දේශපාලන පක්ෂෙට මේ දේශපාලන පක්ෂෙට බැන්නෙ නැහැ. ගිය ආණ්ඩුවට මේ ආණ්ඩුවට බැන ගත්තෙ නැහැ. ඉතිං අලුත්ම ක්‍රමවේදයක් අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා රටේ ඇති කළා. ඒ ක්‍රමවේදය සියලු දෙනා අනුගමනය කළා. පක්ෂයත්, ප්‍රති පක්ෂයත්, අනෙකුත් පක්ෂත් අනුගමනය කළා. ඉතිං අපිට මතකයි එක අවස්ථාවකදි අපේ දේශපාලන නායකත්වය බැසිල් රාජපක්ෂ මැතිතුමා කිව්වා. ජනතා විමුක්ති පෙරමුනේ සහෝදරයින් හය හත් දෙනෙක්වත් පාර්ලිමේන්තුවට එවන්න කියලා. ඒ කෙනෙක්ගෙ දැක්ම. උගත් බුද්ධිමත් රටට වැඩදායී යම් කරුණක් ගැන කතා කරන්න පුලුවන් දැනුමක් තියෙන ඉදිරි අනාගතය පේන අය පාර්ලිමේන්තුවට එවන්න. ඒ නිගමනය තමයි ජනතාව අනුගමනය කළේ. ඒ ඉල්ලීමට කවුරුත් ඇහුන්කන් දීලා අද උගත් බුද්ධිමත් හොඳ විවිධ ක්ෂේත්‍රයන් අනුව දක්ෂතා තියෙන අය විශාල පිරිසක් පාර්ලිමේන්තුවට යනවා. ඒවගේම අපි දකිනවා. පහුගිය කාලය තිස්සේ බලය ලබාගෙන, යම් යම් ප්‍රශ්න ඇති වෙච්ච විශාල පිරිසක් අද එළියට ඇවිල්ලා තියෙනවා. මේ අවස්ථාවෙදි රට ඉදිරියට යයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ බලාපොරොත්තුවට අපි ශක්තියක් වෙන්න කටයුතු කරන බවත් ප්‍රකාශ කරමින්, මේ පශ්වාත් මැතිවරණ සමයේදී කිසිදු කැරලි කෝලාහල බැන ගැනීම්, එක එක්කෙනා අපහසුතාවයට පත් කිරීම් කිසිත් සිදු නොවීම පිළිබඳ අපි සියලු දෙනා ප්‍රීති විය යුතු අවස්ථාවක් මේ අවස්ථාව.

අපිට ඒ ගැන ගොඩක් කතා කරන්න දෙයක් නැහැ. අපේ වර්තමාන අග්‍රාමාත්‍යතුමාට රටපාලනය කරන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියල ප්‍රාර්ථනා කරමින්, නව ව්‍යවස්ථාවක් සකස් කරගෙන පළාත් සභා මැතිවරණය ලගදිම එනවා. ඒ මැතිවරණයටත් අපට මුහුණ දෙන්න සිදු වේවි. අපි ඒ ගැන නෙවෙයි සිහිපත් කරන්නෙ. විශාල සංවර්ධන කාර්යයන් ගොඩාක් රටේ ඇති වෙයි. විශේෂයෙන්ම මාර්ග කාපට් කිරීම ඇතුලුව විශාල සංවර්ධන කාර්යයක් ලගදිම මේ ප්‍රදේශයට ගේනවා. ඒ පිළිබඳවත් සිහිපත් කරමින්, මේ අවස්ථාවෙදි අපි ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපි ආණ්ඩු පක්ෂයේද, ප්‍රති පක්ෂයේද කියල නැතුව අපි මන්ත්‍රීවරු 27 දෙනා සුහදව කටයුතු කිරීම පිළිබඳව අපි සියලු දෙනාටම ප්‍රීතිය ප්‍රකාශ කරමින්, ආදාහන උත්සවය සඳහා මට මෙතනින් නික්ම යාමට අවසර පතනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මේ වෙලාවෙ හැම දෙනාම කතා කළා වගේ 2020 පැවතිච්ච පාර්ලිමේන්තු මැතිවරණයේ විශාල අභියෝගයක් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හමුවේ තබමින් අති විශිෂ්ඨ ජයග්‍රහනයක් ලැබුවා. මොකද රටේ ආර්ථික අර්බුදයක් පවතින අවස්ථාවක, ලෝක ආර්ථික අර්බුදයක් තියෙන අවස්ථාවක, ඉදිරි වකවානුව තුලදි ඉතාම අමාරු කාලයක් තුලදි තමයි මේ රටේ පාලනය භාරගෙන වැඩ කරන්න සූදානම් වෙන්නෙ. ඒ නිසා අපි සියලුම දෙනාට රට වැසියන් හැටියට ලොකු කැප කිරීම් මේ කාලය තුලදි කරන්නට සිදු වෙනවා. ඒ වගේම අපි සතුටු වෙනවා. ගාල්ල දිස්ත්‍රික්කයේ ඉතාම බුද්ධිමත් කණ්ඩායමක් ජයග්‍රහනය කළා. ඒ ජයග්‍රහනය කරපු සියලු මන්ත්‍රීවරුන්ට අපේ ගෞරවය, අපේ සුභාශිංසන එකතු කරනවා. ගාල්ල දිස්ත්‍රික්කය තුල ඉතා විශිෂ්ඨ කණ්ඩායමක් ජයග්‍රහනය කළා වගේම විපක්ෂයේත් ඒ ජයග්‍රහනය ලබපු මන්ත්‍රීවරුන්ට අපි සුභාශිංසන ප්‍රාර්ථනා කරන ගමන්ම, විශේෂයෙන් මේ වෙලාවෙදි මූලික වශයෙන් රට හොඳ දිසාවකට ගමන් කරන්න සූදානම් වෙලා තියෙනවා. ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය දිවුරුම් දීමට හෙට දවසේ සූදානම් වෙලා තිබුනත්, මේවන විටත් අදාල අමාත්‍යාංශ සහ අදාල අමාත්‍යවරුන්ට පැවරෙන කාර්යය භාරයන් සියල්ලම ගැසට් කරලා, අලුත් දිසාවකට මේ රට ගමන් කරවන්න සූදානම් වෙච්ච වෙලාවක, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ වැඩපිළිවෙල ඉතාම සාර්ථකව ගමන් කරයි කියන විශ්වාසයක් ජනතාව තුල පතුරවල තියෙනවා. මොකද වෙනදා කවුරු ආණ්ඩු කළත්, ආණ්ඩුව පත්වෙලා, ඇමතිවරු දිවුරුම් දීලා, මාසයක් දෙකක් තුනක් බලාගෙන ඉන්නවා. අමාත්‍යාංශයට තමන්ට පැවරෙන කාර්යය මොකක්ද? තමන්ට පැවරෙන විෂය පථය මොකක්ද කියල දැනගන්න. හෙට දවසේ දිවුරුම් දෙන අයගේ නම් ටික පමණයි ගැසට් කරන්න තියෙන්නෙ. අනිත් දවසෙ ඉදල ඇමතිවරුන්ට වැඩ කරන්න පුලුවන් පරිසරයක් මේ රට තුල නිර්මාණය කරල දෙන්න ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරය හැටියට නායකත්වය අරගෙන ඒ කටයුතු සිදු කිරීම පිළිබඳව අපි එතුමන්ට අපේ සුභාශිංසන මේ වෙලාවෙ එකතු කරනවා. ඒ වගේම අපේ යුතුකමත් එයම විය යුතුයි කියන එක තමයි අපි මේ වෙලාවෙ සඳහන් කරන්නෙ.

ඊලගට ගරු සභාපතිතුමනි, පක්ෂ පාට බේදයකින් තොරව අපි සියලුම දෙනා මහජන නියෝජිතයන් හැටියට අපට ලොකු වගකීමක් පැවරෙනවා. ඒ වගේම තමයි අපි පහුගිය වකවානුව තුලදි හැම වෙලාවෙම අපිට ඇත්තටම වැඩ කිරීමේ පරිසරයක් නිර්මාණය වෙලා තිබුනෙ නැහැ. මුදල් ප්‍රතිපාදන ප්‍රශ්න, ඒ වගේම රජයේ ප්‍රශ්න ඒ සියලු දේවල් අපි විපක්ෂයක ඉදලා, පාර්ලිමේන්තු බලය නැතිව, ඒ වගේම ජනාධිපතිවරයා පත්කරගෙන ඒ කටයුතු දැන් සිදු කරන වෙලාවෙ දැන් අපට ජනතාවට මොකුත් කියන්න බැහැ. මෙන්න මේ ප්‍රශ්නෙ නිසා මේක කරන්න බැහැ. ඒ නිසා ප්‍රාදේශීය සභාවක් විදිහට අපට අලුතෙන් හිතන්න වෙනවා. මොකද ඉදිරියෙදි අපට මේ ප්‍රදේශයේ ලොකු අභයෝග රාශියක් තියෙනවා. මුදල් ප්‍රතිපාදන කෙසේ වෙතත් කළමනාකරණයකින් අපේ සභාවෙ වැඩකටයුතු ටික ඉස්සරහට ගෙනියන්න වෙනවා. විශේෂයෙන් කොන්ක්‍රීට් දාපු හෝ තාර දාපු පාරවල්වල යන්න බැරි තත්වයක් උදා වෙලා තියෙනවා. එක ගමක නෙවෙයි නාගොඩ කොට්ඨාසය තුලම RDA එකෙන්නම් ප්‍රධාන පාරවල් ටික සුද්ද කර ගන්නවා. අනිත් ප්‍රාදේශීය සභාවට සහ පළාත් සභාවට තියෙන පාරවල්වල කැලේ වැවිලා. ඒ නිසා ඒ පිළිබඳව පළවෙනි අවදානය

යොමු කරන්න. ගරු සභාපතිතුමනි, කොට්ඨාසය තුල හැම මාර්ගයකම යන්න බැරිවෙන විදිහට හැම තැනම පාර දෙපැත්තෙ මාන වැවිලා තියෙනවා. ඒ නිසා එය ඉතාම ඉක්මනින් කඩිනම් ව්‍යාපෘතියක් හැටියට අවධානය යොමු කරලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වගේම අලුතෙන් කොන්ක්‍රීට් කරනු ලැබූ පාරවල්වල දෙපැත්තෙ පස් දාන්නෙ නැතුව තිබීම නිසා අනතුරු දායක තත්වයක් උදා වෙලා තියෙනවා. ඒ නිසා ප්‍රාදේශීය ලේකම්තුමිය සමගත් අපි සාකච්ඡා කරලා, ඒ වගේම දැනට සපිරි ගමක් වැඩසටහන යටතේ පැවැත්වෙන ඒ මාර්ගවල වැඩ අවසන් කළාට ඒ ඇස්තමේන්තුවල පාර දෙපැත්ත ගොඩ කරන්න තියෙනවද කියලා දන්නෙ නැහැ. එහෙම නැත්නම් ශ්‍රම දායකත්වයෙන් කරනවද? ඒ කටයුත්ත පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න ඕන. විශේෂයෙන් සෑම රජයකින්ම විශාල සමෘද්ධි සහනාධාරයක් රට තුල බෙදා හරිනවා. ඒ නිසා ඒ සමෘද්ධි සහනාධාර මුදල ලබා ගන්නා සමෘද්ධි ලාභීන් ඔවුන්ගෙන් යම් දුරකට ශ්‍රම දායකත්වයක් ලබාගෙන, මාසෙකට එක දවසක් හරි ඉස්සර නම් ගම්වල ශ්‍රමදාන කළා. දැන් අද ඒවා කෙරෙන්නෙ නැහැ. පාරක් සුද්ද කර ගන්න ඕන මේකෙන් පිනක් සිද්ද වෙනවා කියලා දෙමව්පියන් ළමයින්ට කියල දෙන්නෙත් නැහැ. නමුත් අපි අලුත් රජයේ වැඩපිළිවෙල යටතේ සමෘද්ධිලාභීන් යොදවලා මාසෙකට එක දවසක් හරි සෑම කොට්ඨාසයක් තුලම සෑම ග්‍රාම නිලධාරී වසමක් තුලම එක මාර්ගයක් හරි පිරිසිදු කිරීමේ වැඩපිළිවෙලක් මේ ප්‍රාදේශීය සභාව මැදිහත් වෙලා ඒ කටයුත්ත සිදු කරන්න නිවැරදි නායකත්වයක් ලබාදෙන්න කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ සඳහා අපට සල්ලි අවශ්‍ය වෙන්නෙ නැහැ.

ඒ වගේම සභාපතිතුමනි, අපේ ප්‍රාදේශීය සභාව තුල උප සභාපතිතුමාගෙ කාමරය ගබඩාවක් වගේ. ඒක ඇතුලෙ ගොඩක් දේවල් ගොඩ ගහලා තියෙනවා. ඊලගට හැම කබඩ් එකක් උඩම පෙට්ටි. ඒ වගේම ඇත්තම කතාව කිව්වොත්, සභාවට සතියෙ දවසකට ආවහම නිකන් අම්බලමක් වගේ. ඒ නිසා සභාවේ පිරිසිදු භාවයක් නැහැ. සභාවක් විදිහට, මෙතනට වැඩක් කරගන්න පිට මිනිස්සු එනවා. අපි හිතමු සභාපතිතුමා හමුවෙන්න කවුරු හරි එනවා. ඒ ආවට පස්සෙ මේ තියෙන කසල ගොඩවල් දැක්කහම සභාවෙ තත්වය මොකක්ද කියල හිතෙනවා. ඒ නිසා මේ වෙලාවෙ මේ සභාවේ තියෙන පිරිසිදු භාවය පිළිබඳව මීට වැඩිය සැලකිල්ලක් දක්වන්න ඕන. ඒ නිසා දැන් ගිහින් සභාවෙ මේසයක් ලග බලන්න. මොන වගේ තත්වයක්ද තියෙන්නෙ කියලා. ඒක නිසා මම මේක මේ වෙලාවෙ කතා කරන්නෙ කාටවත් අගෞරවයක් වෙන්න නෙවෙයි. නමුත් මට මේක අවස්ථාවක් වෙන්නෙ නැහැ මම මේ දේ සභාවට නිකන් ඇවිල්ල කියල ගියොත් වැඩක් වෙන්නෙ නැහැ.ඒ නිසා මේ සභාවේ පිරිසිදුභාවය පිළිබදව, තමන් ඉන්න තැන පිළිබඳව සැලකිල්ලක් දක්වන්න ඕන. මොකද හැම කබඩ් එකක්ම උඩ පෙට්ටි, හැම තැනම වයර් කෑලිද හැම දෙයක්ම හතර වටේම. ඒ නිසා මේව පිළිබඳව සභාපතිතුමාටම අවධානය යොමු කරන්න බැහැ. ගරු ලේකම්තුමියනි, මේ කළමනාකරණය කිරීමේදී මේ පිළිබඳව සැලකිලිමත් වෙන්න. සභාව ලස්සන කිරීමට කටයුතු කරන්න. ඒ මොකද අපි ගෙවීම් කිරීමේදී කිසිම සේවකයෙකුට අඩු කරලා නැහැ. ඒ ගෙවන්න ඕන විදිහට සියලු දේවල් අදාල විදිහට සිදු වෙනවා. ඒ නිසා මේ සභාවේ පිරිසිදු භාවය ඒ වගේම ක්‍රමවත් භාවය පිළිබඳව මීට වැඩිය මේ ඉන්න සියලු සැලකිල්ලක් දක්වන්න ඕන කියන ගෞරවණීය සිහිපත් කිරීම කරනවා. කවුරුවත් අපහසුතාවයට පත් කරන්නවත්, කාටවත් දෝශාරෝපනය කරන්නවත් නෙවෙයි මේක සඳහන් කළේ. ඒ අඩුපාඩුව හදාගත්තොත් හොඳයි. මොකද පිටින් කවුරුවත් ආවොත් ඒක අවලස්සන භාවයක් පේන නිසා, මම ඒක සඳහන් කරන්නෙ. ඉතිං ඒ නිසා ඒ පිළිබඳව අපේ විශේෂ අවධානය යොමු කරන්න කියන එක අපේ මේ ගරු සභාවට මම සිහිපත් කරනවා.

ඊලගට මේ සභාවේ අපි පහුගිය වකවානුව තුලදි සභාවේ ඇතැම් අපේ මන්ත්‍රීවරු සභාපතිතුමාට චෝදනා කරනවා. කොරෝනා අවස්ථාවේදී සිදු වූ සිද්ධිය සම්බන්ධයෙන් සභාපතිතුමන්ට චෝදනාවක් ඉදිරිපත් කළා. ඒ සිද්ධිය මම නැවත සිහිපත් කිරීමක් කරන්නෙ. ඒ අවස්ථාවෙදි ඒ කාලෝචිත විදිහට තමයි කටයුතු කලේ. අපි ගෙවල්වලට ගිහිල්ල දෙන්නෙ නැහැ. ඒ නිසා මොනව හරි දෙනවද කියලා, ඒ දේ ලබා ගන්න ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා, ප්‍රාදේශීය සභාවෙ ලේකම්තුමිය සමග සභාපතිතුමා සමග අදාල විෂයය කරන

නිලධාරී සමඟ ඒ සම්බන්දයෙන් සාකච්ඡා කරලා, මොනව හරි ලැබෙන්න තියෙනවද කියන එක හොයල බලල කටයුතු කරන්න ඕන. ඒක තමයි මන්ත්‍රීවරයගෙ වගකීම සහ යුතුකම. ඒ නිසා සමහර වෙලාවට එහෙම හොයන්නෙ නැතිවුනහම සභාපතිවරයා තමන්ගෙ බලතල පාවිච්චි කරලා එක විදිහකට කටයුතු කරන්න සිද්ද වෙනවා. ඒ නිසා කොරෝනා වෛරසය වෙලාවෙ හැම දෙනාම ඒකට සම්බන්ධ කර ගන්න බැරි වුනත් කීපදෙනෙක් හරි සම්බන්ධ වුණා. මම නම් ඒ කටයුතුවලට පෞද්ගලිකව සම්බන්ධ වෙලා ඒ කටයුතු නිවැරදිව කළා. ඒ වගේම අපි අනිත් සභා දිහා බැලුවහම, මේ කාර්යයන් සඳහා විශාල මුදලක් වැය කරලා තියෙනවා. විශේෂයෙන්ම ඒ අවස්ථාව වන විට දැඩි නියගයක් පැවතුනා. ඒ සඳහා වතුර ලබා දෙන ගමන්ම තමයි ඔය කටයුතු කලේ. ඕන කෙනෙකුට චෙක් කරල බලන්න පුලුවන් කොච්චර වතුර ප්‍රමාණයක් බද්දෙගම ඉදල මෙහේට ගෙනැල්ල බෙදා හැරියද කියලා. ඒ ටිකේ මාපලගමදි පියල් මන්ත්‍රීතුමා බවුසරෙන් බැස්සෙ නැහැ. ඒ නිසා ලොකු සේවාවක් ඒ වෙලාවෙ කළා. ඒ වගේම විශබීජහරණය සඳහා ඒ බෙහෙත් ගෙනැල්ලා, ඒ අදාළ සේවකයො යවලා, ඒ වගේම ඒ සේවකයොන්ට කෑම බීම පවා සභාවෙන් දීලා, ලක්ෂ දෙකහමාරක් වගේ පොඩි මුදලක් තමයි මේ කාර්යයන් සඳහා අපේ සභාව තුල වියදම් කළේ. ඒ නිසා ඒක විනිවිද භාවයකින්, සමහර වෙලාවට ඒකෙ සන්නිවේදනයේ මොනව හරි දුර්වලකම් තිබුනද කියන එක අපි දන්නෙ නැහැ. නමුත් සභාවක් හැටියට ඉතාම අඩු මුදලකින් ඒ කටයුතු කරන්න පුලුවන් වුනා. අපි ඇත්තටම සතුටු වෙනවා. ඉතාම අඩු මුදලකින් ලොකු කාර්යය භාරයක් කළා. ඒ පිළිබඳව ඒකෙ ගෞරවය අපට හම්බ වුනේ නැත්තෙ, සමාජ මාධ්‍ය ජාලයේ ඒකට අභිබවා වෙන දේවල් තමයි ප්‍රචාරය වුනේ. ඒකෙ හොද නෙවෙයි සමාජ මාධ්‍යවල සඳහන් වුනේ. ඒ නිසා මේ වෙලාවෙදි සියලු මන්ත්‍රීවරුන්ට ඒ දායකත්වය දැක්වීම පිළිබද ඒ වගේම කොරෝනා වෛරසය වෙලාවෙ නාගොඩ ප්‍රාදේශීය සභාවක් හැටියට අපිට කරන්න පුලුවන් ඉහලම සේවාව ඒ වෙන කොට අපි සභාව තුලින් කළා. ඒ නිසා අපි සතුටු වෙනවා. අපට සභාවක් විදිහට කවුරු මොනදේවල් කළත් ආපස්සට හැරිල බැලුවහම යම් දුරට අපි අපිට සතුටු වෙන්න පුලුවන් වැඩ කොටසක් කළා. ඒ නිසා දැන් අපට ඊට වැඩිය වැඩ කොටසක් කරන්න තියෙනවා. මොකද ආණ්ඩුව ජනාධිපතිවරයා, ඒ සියලු බලතල ලැබිනු නිසා ඉදිරියෙ මීට වැඩිය අපි කටයුතු කරන්න ඕන. කියන සිහිපත් කිරීම මේ වෙලාවෙ සිදු කරනවා. ඒ වගේම අපි ජයග්‍රහයක් ලැබුවාය, ඒ වගේම තව කණ්ඩායමක් පරාජයට පත් වුනාය, තව කණ්ඩායමක් අපහසුතාවයට පත් වෙන්න අපි කිසිසේත්ම රට තුල කටයුතු කළේ නැහැ. ඒ සමගිය මැතිවරණ කාලය තුලදි වගේම හෙට දවසේත් පවත්වා ගත යුතුයි. ඒ නිසා මම දකිනවා අපේ විපක්ෂ කණ්ඩායමට අසමගියක් තුලින් ලොකු පරාජයක් ලබන්න සිද්ද වුනා. රටට ඒක ඉතාම අහිත කරයි. නමුත් රටේ තීන්දු තීරණ ගන්න විපක්ෂයක ප්‍රධානීන්ගේ ඒ වැරදි තීරණ නිසා අහිංසක ගමේ පාක්ෂිකයින් අද දුක් විදින තත්වෙට පත් වුනා. ඒ පිළිබදව කණගාටු වෙනවා. මොකද අසමගිය තුලින් තමයි ප්‍රතිවිපාක විපක්ෂයට ලැබුනෙ. ඒ නිසා පරාජය ජයග්‍රහනයේ සලකුණක් හැටියට සලකගෙන ඉදිරියෙ කටයුතු කරයි කියන දැඩි විශ්වාසයක් අප තුල තියෙනවා. ඒ නිසා අපි හැම දෙනාම රටේ පුරවැසියන් හැටියට ඉදිරියෙදි යමක් කරන්න පුලුවන්නම්, ඒ දේ අපි සියලු දෙනා එකතු වෙලා කරමු කියන ගෞරවණීය සිහිපත් කිරීමත් කරමින්, ඔබ සැමට සුබ අනාගතයක් පතමින්, නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් එඩේර ආරච්චි මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමාගෙන් අවසරයි. අද අපි නව ආණ්ඩුවක් පිහිටුවලා පළවෙනියටම සභාවාරයක් ගන්නෙ අද. ඒ නිසා මම සතුටට පත්වෙනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ යටතේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේත්, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේත් නායකත්වය තුල ආණ්ඩුවක් බිහි කරලා, මේ ප්‍රාදේශීය සභාව තුල අපි මෙච්චර කාලයක් බලාපොරොත්තුවෙන් සිටි, ඒ ගමට කරන්න පුලුවන් යුතුකම මෙහෙවර ඉටු කරන්නට අපට ඉදිරියෙදි ශක්තිය ලැබෙයි කියල අපි විශ්වාස කරනවා. ඒ වගේම මේ ජයග්‍රහණය වෙනුවෙන් ඡන්දය ලබාදුන් සියලු දෙනාට ස්තූතිය සහ ගෞරවය පුද කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි මෙච්චර දවසක් කතා කළා මට මතකයි. තරංග මන්ත්‍රීතුමත් කතා කලා. තමාගේ ප්‍රශ්න යොමු කළ විට, ඒ ප්‍රශ්න යොමු කරන තැන්වලට, ලිපියක් යොමු කරලා, අඩුම ගණනෙ එහි පිටපතක්වත් තමන්ට ලැබුනෙ නැහැ කියලා පහුගිය කාල පරිච්ඡේදය තුලම සියලු දෙනාම කතා කො. ලිපි ආයතනවලට යොමු කළාට පස්සෙ ඊට අදාල ලිපිය, ඒ කරුණ ඉදිරිපත් කළ අදාල මන්ත්‍රීවරයා වෙත ලැබීමට සලස්වන්න කියලා ඉල්ලීමක් කළා. නමුත් මම ගිය සතියෙත් මම ඇහුවා. අසවල් ස්ථානය සඳහා ඒ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය  ලිපි ලේඛන නිකුත් කළාද කියලා. අපරාදෙ කියන්න බැහැ මම සංතෝෂයට පත් වෙනවා. මම ඒ කතා කළ කරුණු පිළිබඳව දැනුවත් කරමින්, මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය උඩුගම යොමුවටත්, මටත් පිටපතක් ඇවිල්ලා තියෙනවා. පොලිස් ස්ථානාධිපති පොලිස්ථානය, මාර්ග අවහිරය හා මහජන පීඩාව සම්බන්ධව කටයුතු කරන්න කියලා පිටපතක් මට ලැබිල තියෙනවා. බොහොමත්ම සංතෝෂයි. ගරු සභාපතිතුමනි, මෙන්න මේක තමයි වෙන්න ඕන. මේ නිවැරදිතාවය දකින්න මේ අද මෙතනට එන්න සියලු මන්ත්‍රීවරු කතා කිරීමෙදි යම් උත්සාහයක් ගත්තා. මම හිතනවා දැන් ඒ අවශ්‍ය කරන ඒ යාන්ත්‍රණය සැකසී අවසන් කියලා. ඒක නිසා මෙන්න මේක තමයි විය යුත්තේ. අපි කතා කරන්නෙ මේ සභාවාර්තාව පුරවන්න නෙවෙයි. හැමදාමත් අපි මේ සභා වාර්තා පුරවලා, කතා කරලා අන්තිමට ඊ ළඟ මාසෙත් මෙතනට එනවා. නිකන් බලන්න. අපි 27 දෙනෙක් මේ කාල පරිච්ඡේදය තුල, මේ සභාවට ඇවිල්ලා, මේ අපේ සභාවෙ බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන්, ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන්, ජනතාවගේ අනාගතය වෙනුවෙන් අපේ මෙහෙවර හා දැක්ම යටතේ අපි මොනවද කරල තියෙන්නෙ කියල කල්පනා කරන්න. අපි මේ ඇවිල්ල අපේ පඩි පැකට් එකත් අරගෙන අපි ගෙදර යනවා. අපි ඇත්තටම මේ සභාවෙන් විය යුතු ක්‍රියාමාර්ග ගැන සාකච්ඡා කළාද? අපි මේ සභාවෙ ඉදිරි දැක්ම ගැන කතා කළාද? අපි මේ සභාවට ආදායම් උත්පාදනය කරන්න කියල ක්‍රියාවලියක් සම්බන්ධව කතා කළාද? නැහැ සභාපතිතුමනි. ඒක තමයි අපේ දුර්වල කම් හැටියට මම කතා කරන්නෙ. ඉදිරි දිනයේදිවත් අඩුම තරමේ ආණ්ඩුවක් තියෙන සභාවක් වශයෙන්, බලයක් තියෙන සභාවක් වශයෙන් ඔබතුමාගෙ නායකත්වයක් යටතේ, පැහැදිලි දැක්මක් ඇතුව, යම් කිසි ක්‍රියාවලියක් සංවිධානය කරලා, ඒක සාකච්ඡාවට බඳුන් කරන්න. මේ ප්‍රාදේශීය සභාවෙ මහ සභා වාරය තුල මේ සභාව ගොඩ නැගිය හැක්කේ කෙසේද කියලවත් කතා කරන්න. අපි එක එක්කෙනා නිකන් ප්‍රශ්න කියල මෙතනින් පිටවෙලා ගියා වගේ නෙවෙයි. සභාපතිතුමා මේ අවුරුදු පහ යන කොට අපෙන් යුතුකමක් මෙහෙවරක් අපේ සමාජයට දායක වෙන්න ඕන. ඒක මිනිස්සු අපෙන් බලා පොරොත්තු වෙනවා. අපිත් බලපොරොත්තු කන්දක් තියාගෙන සභාවට ආවා. අපට මිනිස්සු අහන දේවල්වලට ප්‍රශ්නවලට උත්තරේ දීගන්න තවමත් බැරි වෙලා තියෙනවා. ඒක නිසා අපි 27 දෙනෙක් මේ ප්‍රාදේශීය සභාවේ ඉඳගෙන කරන දේ ගැන අවට සමාජයේ ජනතාව බලාගෙන ඉන්නවා. බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒක නිසා අපට දැන් ශක්තිමත් ආණ්ඩුවකුත් තියෙන නිසා  අපට අපේ භූමිකාව ඉෂ්ඨ කරගන්න ඔබතුමා පැහැදිලි දැක්මක් සහිත වැඩසටහනක් ඊලග සභාවාරයේදීවත් ඉදිරිපත් කරන්න කියල ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි මේච්චර කල් ගම්පෙරලිය ඊට පස්සෙ අපේ ආණ්ඩුව ආවට පස්සෙ ලක්ෂ 20 ගණනෙ කොන්ක්‍රීට් දාන්න, වැඩසටහන් කරන්න දුන්නා. මම දැකපු දෙයක් තියෙනවා. ගම් පළාත්වලට ගියාට පස්සෙ ඒ ව්‍යාපෘති කිරීමේ දී ලක්ෂ පහේ කොන්ක්‍රීට් එකක් දැම්මනම්, මීටර් 85 දාල දෙපැත්තෙ පස්ටිකවත් දාගන්න විදිහක් නැහැ. අද වාහනයක් ගියාට පස්සෙ මනුස්සයෙක් අවොත්, එක්කො ඒකෙන් පිට තමයි යන්නෙ. නැත්නම් වෙලේ වැටෙන්නෙ. වාහනයක් යන කොට වාහනේ යට වදිනවා. ඊට පස්සෙ කාරෙකක් ගියොත්, බයිසිකලයක් ගියොත්, ඒ මිනිහ ඒකෙන් වැටිල තුවාල වෙච්ච අවස්ථා අනන්තව තියෙනවා. මේක මහජන පීඩාවක් මේක මහජන අවහිරතාවක්. ඒක නිසා ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කරලා, ඔබතුමා අපේ ප්‍රාදේශීය සභා පාරවල් කොන්ක්‍රීට් කරලා සංවර්ධනය කිරීමේදී, මාර්ග අනතුරු අවම වන ආකාරයට, ව්‍යාපෘති සකසන්න කියලා කියන්න. මේ අනතුර ඉවත් කරන්න කටයුතු කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, ලබන මහ සභා වාරයට ඔබතුමාගේ ඉදිරි දැක්ම පිළිබඳව වැඩ සටහනක් සාකච්ඡා කරන්න. මේ සභාව තුල අපි කතා කරන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න. ඒ අවශ්‍ය

වැඩපිළිවෙල සකස් කරන්න කියන ගෞරවණීය ඉල්ලීම නැවත වතාවක් ඉල්ලා සිටිමින්, ඔබ සියලු දෙනාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, අලුත් ආණ්ඩුවක් අපට අපි බලාපොරොත්තු වුන විදිහට පත්වෙලා තියෙනවා. ඒ වගේම අපි බලාපොරොත්තු වුන අපේ නායකයො ඒ තැන්වලට මන්ත්‍රීවරු වශයෙන් පත්වෙලා තියෙනවා. ඒ වගේ පසුගිය කාලෙ වේදිකාවෙ කියවපු සමහර කතා සියල්ලම බොරු වෙලා, ජනතාව ඒ සියල්ලම ප්‍රතික්ෂේප කරලා තියෙනවා. දේශපාලන වේදිකාවෙ සහල් මිල, පරිප්පු මිල, සැමන් මිල පිළිබඳව කතා කළාට, ඒවා ජනතාව ප්‍රතික්ෂේප කරලා තියෙනවා. ඒ වගේම අපේ ජයවීර මන්ත්‍රීතුමා කිව්වා අපට කරන්න ඕන වැඩ. ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියෙදි හොඳ දැක්මක් ඇතුව, හොඳ නායකයෙක් යටතේ, අපි ඒවා අපේ රජයෙන් කරන්න බලාපොරොත්තු වෙනවා. අපේ අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ක්‍රියා කලාපය ජනතාව ඉතා ඉහලින් අනුමත කරලා තියෙන බව පෙනී යනවා. ඔබ ඇමතු දූරකතනය විසන්දි වෙලා තියෙනවා, ඒ වගේම මාලිමාවට උතුර දකුණ හොයා ගන්න බැරිවුනා. අලියා කැලේටම ගියා. ඒ වගේ දේශපාලන තීන්දුවක් ජනතාව දීල තියෙනවා. පොහොට්ටුව විකසිත වුනා. ඒ නිසා ජනතාව දීපු තීන්දුව ගැන අපි කියන්නෙ. ඔබතුමාලගෙ හිත රිද්දන්න නෙවෙයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපට ඉදිරියෙදි භාරදූර කාර්යයක් කරන්න සිදුවෙලා තියෙනවා. අපි එය සභාවක් හැටියට, අපට අපේ සභාපතිතුමාට, ඒ ජයග්‍රහන කරා යන්න හැකියාව ලැබෙයි කියලා හිතනවා. මොකද කොරෝනාවෙනුත් අපි ජයග්‍රහනය කරල තියෙනවා. රට මේ ආකාරයෙන් නාස්තිය දූෂණය නැතුව තව ඉදිරියට ගියොත්, අපට පුලුවන් ගරු සභාපතිතුමනි, ඔබතුමාල අපි බලාපොරොත්තුවන මාර්ග සංවර්ධනය, රටේ සංවර්ධනය ඇති කරන්න. ඒ වගේම මත්ද්‍රව්‍ය තුරන් කරන්න. අපේ ජයවීර මන්ත්‍රීතුමා මත්ද්‍රව්‍ය පිළිබඳ කථා කළා. ඇත්තටම මේ ගම්වල පොලීසිවල තමයි පොඩි පොඩි දේවල් තියෙන්නෙ. දැන් ජාතික මට්ටමෙන් මත්ද්‍රව්‍ය සම්පූර්ණ අත්අඩංගුවට ගැනීම් සිදුවෙමින් පවතිනවා. ඒ වගේම අපි බලාපොරොත්තු වුන ආකාරයට, හොඳ රජයක් මගින් කරගෙන යන ව්‍යාපෘති දෙස සතුටින් ජනතාව බලාගෙන ඉන්න බව පේනවා. ඒ නිසා අපට දීර්ඝ වශයෙන් කතා කරන්න අවශ්‍ය වෙන්නෙ නැහැ.

ඒ වගේම පහුගිය කාලෙ අපේ මත්තල ගුවන්තොටුපොල වී ගබඩාවක් කරනවයි කිව්වා. අන්තිමට දැන් සිරිකොත වී ගබඩාවක් කරන්න වෙලා. අයිතිකාරයෙක් නැති තත්වයට පත්වෙලා. ඒ වගේ දේවල් සිදු වුනා. පාර්ලිමේන්තු යනවයි කියපු, දියවන්නාවට යනවයි කියල වහසි බස් දොඩපු සමහර මන්ත්‍රීවරුන්ට දියවන්නාවට යන්න බැරි වුනා. ඒ වගේ කළකම් පළදෙනව වගේ සමහර වෙලාවල්වල අපට පෙනුනා. ඒ වගේම හොඳ නායකයොත් විපක්ෂෙ වුනත් හොදට පාර්ලිමේන්තුවෙ සිටිය යුතු අයත් පැත්තකට විසි වෙලා තියෙනවා. ඒ වගේම අපි වැඩ කරපු, අපේ ආසනේ සම්පත් අතුකෝරාල මැතිතුමා විශිෂ්ඨ ජයග්‍රහනයක් කරල තියෙනවා. නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් එතුමා එක් ලක්ෂ විසි අට දහස් ගණනක් ඡන්ද ලබාගෙන ජයග්‍රහනය කළා. එතුමාට අපි සුභ පතනවා. එතුමා හැම ඡන්දයක් ගණනටම ප්‍රදේශයේ ඡන්ද දායකයන්ට ගහක් හිටවන්න පැලයක් රෝපනය කරන්න තීරණය කරල තියෙනවා. ඡන්ද ගානටම ගස් වැවෙනවා. කොච්චර හොඳ නායකයෙක්ද කියල අපට හිතෙනවා. ඒ වගේම අපේ සභාවට අයිති අනිත් අපේ ඉසුරු දොඩංගොඩ මැතිතුමා ඉතාම හොඳ තරුණයෙක්. එතුමාගේ ජයග්‍රහනයටත් අපි සුභ පතනවා. අපට මන්ත්‍රීවරු දෙදෙනෙක් අපේ සභාවට ලැබිල තියෙනවා. අපි ඒ සියල්ලටම සුභ පතමින්, අලුතෙන් පත්වුන අතිගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, ඒ වගේම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත් අපි දීර්ඝායුෂ හා තවත් කාලයක් මේ රට වසර ගණනාවක් පාලනය කරන්නට ලැබේවායි කියල ප්‍රාර්ථනා කරමින්, ඔබ සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. සියලු දෙනාටම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමන්ලා, සියලුදෙනාගෙන් අවසරයි. සභාපතිතුමා කතා කරන්න කියපු හින්දා කතා කරන්නෙ. ඔක්කොටම අමතක වුනා මාස්ක් එක ගලවපු එක. දැන් ඒ ගැන සතුටු වෙනවා. එහෙම ගලවන්න උදවු කරපු සියලුම රජයේ නිලධාරීන්ගෙ ඉඳලා දේශපාලන අධිකාරියේ ඉඳල සියලු දෙනාට ගෞරවාන්විත ස්තූතිය පුද කරමින්, මම මගේ කොට්ඨාසෙ සහෝදර මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ දෙන සංවර්ධන වැඩකටයුතුවලදී, සමහර වෙලාවට මට හිතෙනවා මේක තමයි ඉතාමත්ම ඕනැ දේ කියලා. හැබැයි ජනතාවට ඕන දේ ඔබට පෙනෙනවනම්, ඔබගෙන් මම ඉල්ලා සිටිනවා. ඒක මට පැහැදිලි කරල දෙන්න. අපි එකමුතු වෙලා අපේ කොට්ඨාසෙ වැඩකටයුතු ටික කරගෙන යමු කියන ගෞරවණීය ආරාධනාව කරනවා. මොකද බලය කියන එක අද මට තියෙනවා. හෙට වෙන කෙනෙකුට යනවා. ඒ නිසා ජනතාවගේ කැමැත්ත පරිදි ඒ කටයුතු කිරීමට තමයි අපි බලයේ රැඳී සිටින්නෙ. ඒක නිසා මම ඔබගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. ඔබට දැන් දීපු විස්තර පත්‍රිකාව අනිවාර්යයෙන්ම සම්පූර්ණ කරලා දෙන්න. අපි දෙන්න සාකච්ඡා කරල කටයුතු කරමු කියල සිහිපත් කරමින්, ඔබ සියලු දෙනාම ඉතාමත්ම සතුටින් අද දවසෙ පක්ෂ විපක්ෂ නැතුව ගරු සභාපතිතුමාගෙ ප්‍රධානත්වයෙන්, සූදානම් කළ තේ පැන් සංග්‍රහය රස විදලා, අපි එකමුතුව මෙතනදි ප්‍රකාශ කළා වගේම, අපි ඉදිරි වැඩ ටිකත් ඒ විදිහට කරගෙන යමු කියලා කරුණාවෙන් සිහිපත් කරමින්, මම නිහඩ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා, සභාවෙ ලේකම් තුමිය, ප්‍රධාන සියලු දෙනාගෙන් අවසරයි. මම පළමුවෙන්ම එක්සත් ජාතික පක්ෂය සහ සමගි බලවේගය වෙනුවෙන් මෙවර ගාලු දිස්ත්‍රික්කය වෙනුවෙන් තරග කළ කණ්ඩායමේ ජයග්‍රහනය කළ දිස්ත්‍රික් නායක, ගයන්ත කරුණාතිලක මැතිතුමාටත්, මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමාටත් සුභ පතනවා. මේ වෙලාවෙ ගාලු දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් විපක්ෂයේ හඩක් යොමු කරන්න පත්වෙලා, දියවන්නාවට පාතබන ඒ දෙපළට මම අපේ ගාලු දිස්ත්‍රික්කයේ සියලු දෙනාගේ උනුසුම් සුභ පැතුම් පළමුවෙන් පුද කරනවා.

ඒ වගේම සභාපතිතුමනි, මේ වෙලාවෙ විශේෂයෙන්ම මම සිහිපත් කරනවා නාගොඩ ප්‍රාදේශීය සභාවෙ පහුගිය කාලෙ ඔබතුමා ප්‍රාදේශීය සභාව පොදු ජන පෙරමුණ ජයග්‍රහනය කරලා, ජයග්‍රහනය කළාට, ඔබතුමාට ප්‍රාදේශීය සභාවෙ බලය තිබුනට, රාජ්‍ය බලය රජයේ පාලනය තිබුනෙ වෙනත් පැත්තකට. කෙටියෙන් කිව්වොත් අපේ පැත්තට. ඒක නිසා වැඩ කරන්න අවකාශයක්, මුදල් නැතෙයි කියල කිව්වා. හැබැයි මම මේ වෙලාවෙ ඔබතුමාට මුලින්ම සිහිපත් කළා. සභාපතිතුමනි, මම හැමදාම ඔබතුමාට සිහිපත් කරනවා. නාගොඩ ජනතාවගේ එක බලාපොරොත්තුවක් තමයි නාගොඩට පෙරපාසල් ගොඩනැගිල්ලක්. එය ඉදිකර ගන්න ඉඩම් කැබැල්ලක්. ඔබතුමාට සභාවටත් ඔබතුමාගෙ පක්ෂයටත් බලය ලැබිච්ච වෙලාවෙ, මේ ලැබිච්ච අවස්ථාවෙන් නාගොඩට ස්ථාවර පෙරපාසලක් ගොඩනගා ගන්න ඔබතුමාගෙ කැපකිරීම කරන්න. මොකද මේ වන විටත් සභාවේ අපි, සභාවේ මාසික දීමනාව දීලා සභාවෙ පෙරපාසල පවත්වගෙන යන්නෙ. මොකද නාගොඩ ප්‍රාදේශීය සභාවෙ පෙරාසල් රාශියක් තියෙනවා නමුත් නාගොඩ පෙරපාසලට විතරයි අපි බදු මුදල් ගෙවලා කුලියට පෙරපාසලක් පවත්වාගෙන යන්නෙ. මේ පිළිබඳ ඔබතුමාගේ කාරුණික අවදානය යොමු කරලා, ඒ පිළිබඳ ඉක්මන් පියවරක් අරගෙන නාගොඩට පෙරපාසල් ගොඩනැගිල්ලක් ඉදිකර ගන්න අවස්තාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමනි, මතක් කරන්න ඕන හොරංගල්ල මාපලගම ගෝනලගොඩ මාර්ගය පහුගිය කාලෙ ගයන්ත කරණාතිලක මැතිතුමාගෙ මැදිහත් වීමෙන් කාපට් කරන්න ලක්ෂ 971 වියදම් කරලා ආරම්භ කළා. හැබැයි මාර්ගයේ වැඩ අතරමග නැවතිලා තියෙනවා. වත්මන් රජයේ ප්‍රධානීන් හැටියට ඔබතුමන්ලට සිහිපත් කරනවා. මේකෙ නැවතිච්ච වැඩ කොටස ඉදිරියට ගෙනියන්න. ඒ පාරෙ වැඩ ඉවර කරන්න. ඔබතුමන්ලගෙ අවදානය යොමු කරන්න කියලා මම මේ වෙලාවෙ කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ වගේම

සභාපතිතුමනි, තල්ගස්වල බදාදා සති පොල පිළිබඳව අපි හැමදාම ඔබතුමාට කතා කරනවා. නමුත් පහුගිය කාලවකවානුව තුල ඔබතුමා මුදල් හිඟතාවය පිළිබඳ කතා කළා. මෙන්න මේ සති පොල ක්‍රමවත්ව, විදිමත්ව ඒ වගේම හොඳ මේ පළාතෙ තියෙන ප්‍රධාන සති පොලක් හැටියට සකස් කරන්න, දැන් ඔබතුමාට අවස්ථාවක් ලැබිල තියෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා, මම මේ වෙලාවෙ ඉල්ලා සිටිනවා. මොකද මේ පොල පුළුල් කරලා, ඒ වගේම යම් සැලැස්මක් හදලා, ජනතාවට අවහිරයක් නොවන විදිහට, පුලුවන්නම් දිවා රාත්‍රී පොලක් හැටියට හරි, මේ පොල දියුනු කරන්න ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා.

ඒ වගේම මේ වෙලාවෙ කරුණිකව සිහිපත් කරනවා. සභාපතිතුමනි, උඩුගම ඇප්ත්‍රොප්වත්ත පිළිබඳ මේ දිනවල විවිධ කතාබහට ලක්වෙනවා. මේ ඇප්ත්‍රොප් වත්තෙ රජයට අයත් ප්‍රාදේශීය ලේකම් යටතේ තියෙන ඉඩමෙ, පහුගිය දිනවල මැතිවරණ ජයග්‍රහනයත් එක්ක, මේ දිනවල ඒ ඉඩම විවිධ පුද්ගලයින් විසින් බලහත්කාරයෙන් අත්පත් කරගෙන තේ වගා කරනවා. විවිධ වගාවන් කරනවා. ඒ වගේම ගෙපල් කපනවා. නිවාස හදන්න හදනවා. මෙන්න මේ වගේ සිද්දීන් වෙනවා. මොකද ඇත්තටම ඉඩම් ලැබිය යුතු පුද්ගලයින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දහස් ගණන් ලේඛනවල ඉන්නවා. ඒ අය නෙවෙයි. මේ ඉඩම් තියන අය තමයි මේ කටයුතු කරන්නෙ. වැඩියෙන් වගා කරල වැඩියෙන් ඉඩම් එකතු කර ගන්න හදන්නෙ. ඉතිං මේ පිළිබඳ ඔබතුමාගේ අවදානය, ඔබතුමාගෙ රජයේ අවදානය, යොමු කරලා ඒ අවශ්‍ය සුදුසු පුද්ගලයින්ට, මේ සඳහා අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මේ වෙලාවෙ මැතිවරණය පිළිබඳවත් සිහිපත් කරන්න ඕන. මේ වෙලවෙ එක්සත් ජාතික පක්‍ෂයට දිගින් දිගටම අපේ මන්ත්‍රීතුමන්ලා විවිධ අදහස් පළ කළා. හැබැයි මේ වෙලාවෙ තමුන්නාන්සෙලට සිහිපත් කරන්න ඕන. එක්සත් ජාතික පක්‍ෂය කියන්නෙ මේ රටේ තියෙන ප්‍රධාන දැවැන්ත දේශපාලන පකෂයක්. හැබැයි මතක තියා ගන්න. එක්සත් ජාතික පක්‍ෂය මේ රටට කරපු මෙහෙවර ජනතාව අමතක කරල නැහැ. අදටත් තමුන්නාන්සෙලා යම් සැනසීමකට පත්වෙනව නම්, මේ පහුගිය කාලය තුල අපේ දිස්ත්‍රික් නායක වජිර අබේවර්ධන මැතිතුමන්, ප්‍රධාන ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන් ඇතුලු, ඒ අය මේ දිස්ත්‍රික්කයට පහුගිය කාලය තුල විශාල වැඩකොටසක් ඉටු කළා. තලගහ ඉදල හිනිදුම දක්වා තියෙන මේ ප්‍රධාන මාර්ගය සංවර්ධනය කරන්න ලක්‍ෂ 66 දහසක් ප්‍රතිපාදන වෙන් කළා. මේ වගේ දැවැන්ත ව්‍යාපෘති ගෙනැල්ල හැම ග්‍රාම නිලධාරී වසමකටම නිල සෙවන ගෙනැල්ලා, මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කෝටි ගණනක ගොඩනැගිලි හදලා, නාගොඩට පොලීසියෙ ගොනැගිල්ලක් ගෙනැල්ලා, මේ වගේ දැවැන්ත වැඩ කොටසක් කරපු පක්‍ෂය තමයි එක්සත් ජාතික පක්‍ෂය. මම කිව්වෙ එක්සත් ජාතික පක්ෂයේ ඒ දැවැන්ත මෙහෙවර. ගාල්ල දිස්ත්‍රික්කය පිළිබඳ ඔය මම ටිකයි කිව්වෙ. හැබැයි එහෙම පක්‍ෂයක් කවදාවත් මේ වගේ දෙකයි පනහට දාන්න එපා. මේ වෙලාවෙ විශේෂයෙන් සිහිපත් කරනවා. පහුගිය මැතිවරණයෙන් ගොඨාභය රාජපක්‍ෂ මැතිතුමන් ප්‍රධාන පවුලේ මල්ලි ජනාධිපති, අයියා අගමැති, අනිත් එක්කෙනා අනිත් ඇමති, අනිත් පුතා අනිත් ඇමති, මේ වගේ ආණ්ඩුවක් මේලෝකෙ කොහෙවත් රටක නැහැ. හැබැයි තමුන්නාන්සෙලා හිතාගෙන ඇති ජාත්‍යන්තර වශයෙන් තමුන්නාන්සෙලගෙ ආණ්ඩුවට, තමුන්නාන්සෙලගෙ නායකයන්ට, ඒ සහයෝගය ලැබෙයි කියලා. මේ පවුලේ සමාගමක් මේ රට පාලනය කරන්නෙ. පවුලේ සමාගමකට කවදාවත් ජාත්‍යන්තර සහයෝගය ලැබෙන්නෙ නැහැ. විශේෂයෙන් මේ මැතිවරණය කළේ කොහොමද කියලා මම තමුන්නාන්සෙලට කියන්නම්. පහුගිය ජනාධිපතිවරණයේ තමුන්නාන්සෙලගෙ ජනාධිපති අපේක්‍ෂකයට 69 ලක්‍ෂයක් ඡන්ද ලැබුණා. අපේ ජනාධිපති අපේක්‍ෂක සජිත් ප්‍රේමදාස මැතිතුමාට පනස් පන් ලක්‍ෂයකට එහා ඡන්ද ලැබුනා. තමුන්නාන්සෙලා දන්නවා. මේ සැරේ ඡන්ද පාවිච්චි වුනේ කොහොමද කියලා. තමුන්නාන්සෙලට 68 ලක්‍ෂයකට එහා ප්‍රමාණයක් ඡන්ද පාවිච්චි වුනා. අපට ඡන්ද පාවිච්චි වුනේ විසිහත් ලක්‍ෂ ගණනයි. අප් ලක්‍ෂ 30 කට අඩු ප්‍රමාණයක් නිහඩව හිටියා. ඒ නිහඬ වුන හේතුව මම තමුන්නාන්සෙලට මේ වෙලාවෙ කියන්නම්. මේ වෙලාවෙ තමුන්නාන්සෙල පොහොට්ටුවෙ, පොදුජන පෙරමුණේ දේශපාලනඥයින් හැටියට සූක්‍ෂම වැඩපිළිවෙක් ගෙනගියා.

ගම්මටට්ටමින් හැම ගමකම බැසිල් රාජපක්ෂ මහතා අපේ ඡන්ද 100 ක් 150 ක් නිහඩ කළා. ඒක තමයි කළේ. ඒක තමයි තමුන්නාන්සෙලගෙ ජයග්‍රහනය. මේව අපි හොඳට අධ්‍යනය කරල තියෙන්නෙ. ඔය සූක්ෂම වැඩපිළිවෙලත් එක්ක ජනතාව මුලාවෙ දැම්මා. මේ වෙලාවෙ ජනතාවට තේරුම් ගියා. මොකක්ද මේ කරල තියෙන්නෙ කියලා. මොකක්ද වුනේ කියලා. මේ ලක්ෂ 30 කට ආසන්න ප්‍රමාණයක් ඡන්දය ලබා දුන්නනම්, තමුන්නාන්සෙලට බහුතරය නෙවෙයි කොහොමටවත් ලැබෙන්නෙ නැහැ. ඇත්ත කතාව මේකයි. ඇත්තටම පහුගිය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තුල අපේ පාක්ෂිකයන්ට අපට මෙහෙවරක් කරන්න බැරි වුනා. තමුන්නාන්සේලා අද මේ සාධාරණ මැතිවරණයක් පැවැත්වුවයි කියල කතා කළා. නමුත් ඒ මැතිවරණය පැවැත්වුවෙ කොහොමද? රනිල් වික්‍රමසිංහ මහත්මයා පහුගිය අපේ ආණ්ඩුව කාලෙ කොමිෂන් සභා පහ ගෙනැල්ලා, මේ රටේ රාජ්‍ය සේවකයට ස්වාධීනව කටයුතු කරන්න, මැතිවරණ කොමිසම අධිකරණ කොමිසම රාජ්‍ය සේවා කොමිසම මේ වගේ කොමිෂන් ගෙනාපු නිසා තමයි. නැතුව කවදාවත් මහින්ද රාජපක්ෂ මහත්තයවත්, ගෝඨාභය රාජපක්ෂ මහත්තයවත් මේ වගේ මැතිවරණයක් කරන්න බලාපොරොත්තු වුනේ නැහැ. ඒ ගොල්ලො මේ වගේ මැතිවරණයකට ගෙනගියේ ඒ ස්වාධීන කොමිෂන් සභා ගෙනාපු නිසා, මේ රටේ ඇතිකරපු ව්‍යවස්ථාදායක වැඩපිළිවෙල නිසා. ඒ නිසා සභාපතිතුමනි, මේකෙ ස්තූතියක් කරනවනම්, එක්සත් ජාතික පක්ෂයට ස්තූති කරන්න ඕන. ඇත්ත කතාව තමුන්නාන්සෙලගෙ ජයග්‍රහනය අපි අරගෙන දුන්නෙ.අපි ගෙනාපු කොමිෂන් සභා නිසා, අපිට, ජනතාවට බලපෑවා. ඒක නිසා මේ රටේ කිසිම රජයේ ප්‍රධාන නිලධාරියෙකුට තමුන්නාන්සෙලට අත තියන්න බැහැ. ඒ කොමිෂන් සභා ගෙනැල්ල තියෙන්නෙ, ඒ මිනිස්සුන්ගෙ රාජකාරිය හරියට කරන්න. විනිවිධ භාවයෙන් රාජකාරි කරන්න. ඉස්සර එහෙම නෙවෙයි දේශපාලනඥයට රජයේ නිලධාරියා යටයි. අද රජයේ නිලධාරියට දේශපාලනඥයා යටයි. ඒකයි ඇත්ත කතාව. ඒ නිසා මේ වෙලාවෙ තමුන්නාන්සෙලා සූක්ෂම වැඩපිළිවෙක් අරගෙන ගිහිල්ලා, මේ ජනතාව මුලා කරලා, තමුන්නාන්සෙලගෙ බහුතරයට වැඩි ප්‍රමාණයක් පාර්ලිමේන්තුවෙ බලය ගත්තට, තමුන්නාන්සෙලා ඉදිරියෙදි ජනතාව ඉස්සරහ ඒ ජනතාවට දීපු පොරොන්දු ඉටු කරන්න ඕන. මම දන්නවා. අපේ සමහර එක්සත් ජාතික පක්‍ෂෙ අපිත් එක්ක හිටපු අයගෙ ගෙවල්වලට, ගිහිල්ලා රස්සාවල් දෙන්නම් කියලා තියෙනවා. ඉඩම් දෙන්නම් කියල තියෙනවා. මේ සැරේ ඡන්ද පොලට යන්න එපාය කියල තියෙනවා. මගේ කොට්ඨාසෙ නෙවෙයි. ජනතාව ඒ කතා පිළිගන්න සාධාරණයකුත් තියෙනවා. මොකද පහුගිය කාලෙ අපිට දැනෙන්න මනුස්සයෙකුට, පාක්ෂිකයට දෙයක් කරන්න බැරි වු.නා මොකද මම කියපු අර කොමිෂන් සභා හින්ද සමෘද්ධි කැල්ලක් දෙන්න ගියත්, දේශපාලනික වශයෙන් මැදිහත් වීමක් වෙන්න අවස්ථාව ලැබුනෙ නැහැ. කොට්ඨාසෙ ඉන්න නිලධාරි හතරදෙනා තමයි ඒ සියල්ල කළේ. ඒක නිසා අපිත් එක්ක ඉන්න අපේ දේශපාලන ධාරාවෙ අපේ ගමේ පාක්ෂියො අපිත් එක්ක වෛරයෙන්, තරහින් හිටියෙ. අපට ඡන්ද පොලට, රැස්වීමකට, ගෙන්වන්න බැරි තත්වෙකට පත් වුණා. මේ වාසිය ප්‍රයෝජනයට අරගෙන බැසිල් රාජපක්ෂ නැමති අපේ ජනාධිපතිතුමාගෙ සහෝදරයා ප්ලෑන් එකක් ගැහුවා. තිතටම වැඩ කළා. දැන් තමුන්නාන්සෙලාට බලය ලැබිල තියෙනවා. අපේ මිනිස්සුන්ටත් බලාපොරොත්තු දීල තියෙනවා. ඒව ඉටුකරන්න කාලය ඇවිල්ලා තියෙනවා. අපි බලමු ඉදිරි කාලය. හැබැයි තමුන්නාන්සෙල මතක තියාගන්න. අපිත් එක්ක ආප්ප කාල ආපු මනුස්සයෙකුත් ඕක ඇතුලෙ ඉන්නවා. එයාටත් යම් බලයකුත් තියෙනවා. එයත් එක්ක තමයි ඔය පොහොට්ටුවෙ ගමන යන්නෙ. යනකොට බලන්න පුලුවන් කොහොමද ඉදිරි ගමන කියලා. ඉතිං ඒ නිසා මේ වෙලාවෙ තව කියන්න බොහෝ දේවල් තියෙනවා. අපි කණගාටු වෙන්නෙ නැහැ. ඔය ගිහිපු වැඩපිළිවෙලත් එක්ක ඔබතුමාල යන්න. අපි බලාපොරොත්තු වෙනවා ප්‍රාදේශීය සභාව හැටියට ජනතාව මෙච්චර කාලයක් බලාගෙන හිටපු, තමන්ගෙ ගමේ වැඩ ටික කරගන්න. සභාවෙ බලය තියෙන්නෙ ආණ්ඩුපක්ෂයට නිසා. ඒකට අවස්ථාව තමුන්නාන්සෙලට තියෙනවා. ධර්මසිරි මන්ත්‍රීතුමා කිව්වා ගමේ කටයුතු කරන කොට මගේ සහයෝගය ලබා දෙන්න කියලා. මම ඔබතුමාට උපරිම සහයෝගය ලබා දෙනවා. පහුගිය කාලෙ ඔබතුමා මගේ වැඩවලටත් සහයෝගය ලබා දුන්නා. ඉතිං ඒ නිසා ඒ සියල්ල අපි දෙන්නා එකතුවෙලා සහයෝගෙන් වැඩ කරමු. ගමට වැඩක් කරනවනම්, මනුස්සයෙකුට වැඩක් කරනවනම්, අපි එතන

ඉන්නවා. මිනිස්සුන්ට උදවු කරන්න. ඒ නිසා තමුන්නාන්සෙලගෙ ඉදිරි ගමනෙ කටයුතු සාර්ථක කරන්න අපට දෙන්න පුලුවන් ශක්තියත් දෙනවා. ඒ වගේම එක්සත් ජාතික පක්ෂයේත්, සමගි බලවේගයේත් ඉදිරි ගමන් මගේ විපක්ෂයේ භූමිකාව තුල රටේ යම් ජනතාවට අහිතකර දෙයක් එනවනම්, ඒ වෙනුවෙන් අපේ දැවැන්ත කැප කිරීම කරලා ජනතාව වෙනුවෙන් පෙනී සිටිනවයි කියල මතක් කරමින්, මම නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මම මගේ සුභ පැතුම් පළමු කොටම එක්සත් ජාතික පක්ෂයේ අපි කෙලින් හිටගනිපු මිනිස්සු. අපි කිව්වෙ නැහැ අර පක්ෂෙට සම්බන්ධ වෙනවයි. මේ පක්ෂෙට සම්බන්ධ වෙනවයි කියලා පිරිසක් හිටියෙ නැහැ. අපි සුලුතරයක් වුනත්, නිර්භයව කිව්වා. අපි එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් කෙලින් හිටගන්නවයි කියලා. ඒක නිසා මේ එක්සත් ජාතික පක්ෂයේ අයිතිය අපි සතුව තියෙනවා. අපි බිංදුවෙ ඉන්නෙ. අපි බිංදුවෙ ඉඳලා, අපි උඩට යන්න බලනවා. ඒක නිසා මට පුදුම හිතුනා. අපේ සහෝදර වනමල් මන්ත්‍රීතුමා, පුන පුනා එක්සත් ජාතික පක්ෂයක් ගැන කියනවා. අපේ කොඩිවිනය වෙන කවුරුවත් නෙවෙයි. එක්සත් ජාතික පක්ෂය අකීකරුව හදපු දරුවෙක් නිසා තමයි අද එක්සත් ජාතික පක්ෂය විනාශ වුනේ. රාජපක්ෂ මහත්තුරුවත්, ගෝඨාභය මහතාවත්, මේ වර්ථමාන ආණ්ඩුවවත් නෙවෙයි, මේකට කෙනෙහිලි කම් කළේ. මෙන්න මේ විදිහෙ අකීකරු දරුවො හදපු එකේ බල තස්නාව නිසාය කියන එක මම කියනවා. ඇත්තටම අද මම කතා කරන්න හිටියෙ නැහැ. ඇත්තටම මම ආශිර්වාද කරන්න හිටියෙ. ඒක නිසා එක්සත් ජාතික පක්ෂයෙන් තමුන්නාන්සෙගෙ කතාව කියන්න තිබුනේ අද නෙමෙයි. මැතිවරණයට කලින්. මැතිවරණයට කලින් පැහැදිලිව කියනවා. එක්සත් ජාතික පක්ෂය කියන්නෙ එකක්, සමගි ජන බලවේගය කියන්නෙ තව එකක්. ඒක නිසා මේක හරියට තාත්ත ගෙදර ඉද්දි, මේ අපේ තාත්තා නෙවෙයි බාප්පා. අල්ලපු ගෙදර කෙනා තමයි තාත්තා කියනවා වගේ කතාවක්. තාත්ත ගෙදර ඉන්නවා. තාත්තට තාත්තයි කියන්න බැහැ. අල්ලපු ගෙදර බාප්පට කියනවා අපේ තාත්තයි කියලා. අවනම්බු කර ගන්නවා. ඒක නිසා අපි දෙපැත්තට ගියේ නැහැ. එක්සත් ජාතික පක්ෂය විනාශ කළේ කවුරුවත් නෙවෙයි සමගි ජන බලවේගය කියන කණ්ඩායම. ඒක නිසා ඒකෙ පාපය අද ඔවුන් ගෙවාවි. හෙට අනිද්ද වෙන කොට රනිල් නැතුව ආණ්ඩුවක් ඒ අයට කරන්න බැරි බව කියනවා. මේ ඉහල කතා කරන දේවල් තමයි. රනිල් නැතුව ආණ්ඩුවක් කරගන්න බැහැ කියන එක කියනවා. රනිල් නැතිවෙච්ච එකේ පාඩුව අපි සියලු දෙනාම තව මාසයක් දෙකක් යන කොට කතා කරන්න පටන් ගනීවි. ඕක තමයි ඇත්ත තත්වය. කොඩිවින කරලා, විනාශ කරලා, ගහ විනාශ වුනාට පස්සෙ, ඒ ගහට පොහොර දාන්න එනවා. ඒක නිසා මම කණගාටුවෙන් වුනත් අපේ සහෝදර මන්ත්‍රීවරයට කියනවා. ඒ සියලුම අයිතිය තියෙන්නෙ එක්සත් ජාතික පාක්ෂිකයන්ට. හොඳත්, නරකත්, පරාජයත් අපි නිර්භයව භාර ගන්නවා. කාගෙවත් පිට පටවන්නෙ නැහැ. මේක අපේ මොකක් හරි අඩුපාඩුවක් වෙන්න ඇති. අපි වර්ථමාන රජයේ හොඳදේත් දකිනවා. මොකක් හරි හොඳ දෙයක් තිබුන නිසා තමයි තුනෙන් දෙක නෙවෙයි, ඊට වැඩිය බහුතරයක් අද රටේ පාලක බලයට දීල තියෙන්නෙ. වර්ථමාන රජය අලුත උපන් දරුවෙක් තවම කුඩා ළදරුවෙක් හැටියට අපි දකින්නෙ. අත්දැකීම් බහුල පිරිසක් එතන ඉන්නෙ. අපි බලමු මොකක්ද වෙන්නෙ කියලා. අපි දැන්ම ඒව විවේචනය කරන්න යන්නෙ නැහැ. මොනව හරි ගමනක් යන්න අපිත් ආශිර්වාද කරනවා. අපි ඇත්තටම සතුටු වෙනවා. අපි හිතුවා තුනෙන් දෙක එනකොට, රතිඤ්ඤා හඬ නිසා පෙලපාලි නිසා පාරවල්වල යන්න බැරි වෙයි කියලා. නමුත් අපි අද තමුන්නාන්සෙලාට ස්තූතිවන්ත වෙනවා. අද මැතිවරණයක් ඊට ඉස්සරින්ද තිබුනද කියලවත් දැන ගන්න බැරි තත්වෙට උදා වුනා. අපි ඒවා කියන්න ලැජ්ජා වෙන්නෙ නැහැ. ඒක තමයි රටේ ඇතිවිය යුතු දේ. හොඳ පාඩමක් කියා දුන්නා. හොඳ ආදර්ශමත් ගමනක් පිළිබඳව කියා දුන්නා. ඒවට අපි ආශිර්වාද කරනවා. නමුත් අපි එක්සත් ජාතික පක්ෂයක් හැටියට පැරදුනේ රටට වැඩ නොකර නෙවෙයි. වැඩ කරල තියෙන්නෙ ඒක තමයි දේශපාලනය කියන්නෙ. මොනව කළත් එදා මහින්ද රාජපක්ෂ මහත්තය පැරැද්දුවා. වර්ථමානෙ රනිල් වික්‍රමසිංහ ඇතුලු ඒ කණ්ඩායමම බිම දැම්මා. ඒක තමයි දේශපාලනේ. අපිට

මිනිස්සුන්ගෙ සිතුම් පැතුම්වලට ගරු කරන්න සිද්ද වෙලා තියෙනවා. අපි තමුන්නාන්සෙලට එක්සත් ජාතික පක්ෂය තුලින් ආදර්ශයක් දුන්නා. හදනවනම් අකීකරු දරුවො අකීකරු උදවිය ගේ ඇතුලෙ තියා ගන්න එපා. ඒක තමයි විනාසෙට මුල කියන පනිවිඩය මුලු ලොවටම දුන්නා. ඒක තමයි අද අපි මේ තත්වෙ ඉන්නෙ. මම මීට වැඩිය ඒ පිළිබඳ කතා කරන්නෙ නැහැ. අපි සියලු දෙනාම තමුන්නාන්සෙලගෙ ජයග්‍රහනයට ආශිර්වාද කරනවා. මොකද මේ රටේ ඇත්තටම පළවෙනි දවසෙම ඒ පාඩම රටට කිව්වා. මම හිතුවා නාගොඩ විතරක්දෝ මේ කියලා. නැහැ මුලු රටේම ඒ දේ සිදු වුනා. මම හිතන්නෙ තමුන්නාන්සෙලගෙ නායකයගෙන් සාමකාමී වෙන්න කියලා පනිවිඩයක් එන්න ඇති. මම කතා කරන්න නොහිටියත් කතා කරන්න සිදු වුනේ අපට විනයක් වුනේ තමුන්නාන්සෙල නෙවෙයි විනයක් වුනේ සමගි සංධානය. එයාල දැන් ආරාධනා කරනවා. සමගි සංධානය ගාවට එක්සත් ජාතික පක්ෂයට එන්න කියලා. එච්චර කොන්දක් නැති මිනිස්සු තවමත් එක්සත් ජාතික පක්ෂය තුල නැහැ. අපි ගාවට කැමතිනම් ඒ උදවියට එන්න පුලුවන්. අද බිංදුවයි. අපි හෙට දවසෙ ඒක පරිවර්ථනය කරනවයි කියන එකත් මම කියනවා.

ඒ වගේම මම සභාවෙ කරුණු දෙකක් පිළිබඳව කතා කරන්න හිටියෙ. එකක් තමයි ගරු සභාපතිතුමනි, බලය පිළිබඳව අපි කතා කළා. බලය තමුන්නාන්සෙට තියෙන කොට මම පාවිච්චි කරන හැටි කුමක්ද කියන එක මතක් කරන්න ඕන. අපේ කොන්ක්‍රීට් කරපු පාරකට, පස්දාල තියෙනවනම්, සරලව හිතන්න එපා තමන්ට පැවරී තියෙන බලය තවත් ආයතනයකට දෙන්න එපා. අනාගතයෙදි තමුන්නාන්සෙලගෙ හෝ වෙනත් කෙනෙකුගෙ වෙන්න පුලුවන්. තව සභාපතිවරයෙක් පත්වුනොත් මෙතන කටයුතු කරන්න බැරිවෙයි. මාර්ග ගැසට් කරලා, සභාවට පැවරිලා තියෙන්නෙ. අපි මේ පාරට කොන්ක්‍රීට් දමන්නද? තාර දමන්නද? කියලා ප්‍රාදේශීය ලේකම්වරිය අපෙන් අහනවා. ඊට යටින් ඉන්නෙ ග්‍රාම නිලධාරී. එතකොට අපි තාර දාන්න එපා කිව්වොත්, දාන්න බැහැ. කොන්ක්‍රීට් එපා කිව්වොත් දාන්න බැහැ. එහෙමනම් අපේ පාරකට විනාශකාරී අන්දමින් කොන්ක්‍රීට් එක වහල පස් දාල තියෙනවනම්, වහාම ක්‍රියාත්මක වෙන්න කියල මේ ගරු සභාවෙ මම කියනවා. ක්‍රියාත්මක විය යුතුයි. නැත්නම් හෙට දවසෙ ඔය පාර විතරක් නෙවෙයි. තවත් දේවල් සිදු වේවි. අන්න ඒ නිසා වගකීමෙන් කියනවා තමුන්නාන්සෙට පැවරී තියෙන බලතල අනුව, තමුන්නාන්සෙගෙ නිලධාරියෙක් එතනට යවලා, වාර්තාව ගෙන්න ගෙන, තමුන්නාන්සෙට නෙවෙයි. ඒ නිලධාරියට අයිතියක් තියෙනවා. අදාළ පොලිස් ස්ථානයේ පැමිණිලි කරන්න. පැමිණිලි කරලා එම තැනැත්තාගෙන් හෝ තැනැත්තියගෙන් යම්කිසි අලාභයක් සභාවට වෙලා තියෙනවනම්, අයකර ගැනීමේ හැකියාවත් තියෙනවා. එහෙම අයකර ගන්න බැරිනම්, අපට අධිකරණයේ සහය පතන්නත් හැකියාව තියෙනවා. මගේ ප්‍රශ්නයක් නොවුනත්, මෙතුමගෙ ප්‍රශ්නයක් වුනත්, ප්‍රදේශයේ ප්‍රශ්නයක් හැටියට සලකලා මම තමුන්නාන්සෙට ඒ ටික මතක් කලේ.

ඒ වගේම පසුගිය පළාත් පාලන ඇමතිවරයා හැටියට හිටියෙ වජිර අබේවර්ධන. එකම ප්‍රාදේශීය සභාවකටවත් කෙනෙහිලිකමක් සිදු වුනේ නැහැ. අපට ලැබිය යුතු සියලු දේවල් සංවර්ධනවලට මුදල් වෙන් කිරීම් කළා. ආදාහනාගාරයට අපට කෝටි දෙකක් මුදල් ලබා දුන්නා. මේ මොහොත වෙනකොට ඒකෙ තත්වය මොකක්ද කියල දන්නෙ නැහැ. ඒක නිසා ඒ මුදල් ලබා දීමේදී මේක පොදු පෙරමුණද මොන පක්ෂයද කියල බැලුවෙ නැහැ. අපි පස්සට ඇද්දෙත් නැහැ. මේක අපේ නෙවෙයි කියලා ගිහිල්ල කිව්වෙ නැහැ. දැන් තමුන්නාන්සෙලගෙ ආණ්ඩුවක් තියෙන්නෙ. තමුන්නාන්සෙලගෙ පළාත් පාලන ඇමතිවරයෙක් පත්වේවි. ඒක නිසා ඒ ඇමතිවරයා හරහා මේ කටයුත්ත දැන් ක්‍රමවත්ව, ඉක්මන් කර ගන්න හැකියාව ලැබේවි. මම හිතනවා මේ ප්‍රදේශයට අඩුවක්ව පවතින්නෙ ආදාහනාගාරය. අපේ කාලෙ 2002 වර්ෂයේ ඉදල ඊටත් එහා ඉතිහාසෙ ඉදලා කවුරුත් ඉල්ලන එකක් තමයි මේ ආදාහනාගාරය. දැන් එහෙනම් ඒ ඉඩම පැවරිල තියෙන්නෙ. ඉඩම සභාව සතුවෙලා තියෙන්නෙ. දැන් මුදල් ටික හොයලා මුදල් ටික ලැබිල තියෙනවනම්, ඒක කොහොම හරි කරන්න. තමුන්නාන්සෙගෙ දක්ෂතාවය මත ඒ කටයුත්ත කරන හැටියට මම ඉල්ලා සිටිනවා. අපි සියලු දෙනාම මෙතනට ඇවිල්ල ඉන්නෙ ප්‍රදේශයට යමක් කරන්න. දැන් නාගොඩ සභාවට විතරක් නෙවෙයි සමස්ථ සියලුම සභාවලට ආණ්ඩුවෙ, රජයේ ආශිර්වාදය ලැබේවි. මම දකිනවා

තමුන්නාන්සෙලගෙ ජයග්‍රහනයට තව එක දෙයක් හේතුවුනා. අපිත් ඒක අනුමත කරනවා. මොකක්ද මේ පාතාලය විනාශ කරනවා. ඒ පාතාලය විනාශ කරීමට අපෙත් සහයෝගය ලබා දෙනවා. ඉහල මට්ටමෙන් මත්පැන් විනාශ කළත්, බිම්මට්ටමේ තවම ඒක ක්‍රියාත්මක වෙනවා. පහල නිලධාරීන් විසින් තවම පහල කඩතොලු වසා නැත. එම කඩතොලු වසා ගැනීම ටිකක් අසීරුයි. ඒකනිසා මම යෝජනාවක් කරනවා තමුන්නාන්සෙලගෙ මැති ඇමතිවරුන්ගෙන් තමුන්නාන්සෙලා ඉල්ලීමක් කරන්න. පහල කඩතොලු වසනතුරු මේක නිම කිරීමට නොහැක කියලා. ඉහල කඩතොලු වහන ගමන්ම පහල කඩතොලු ටිකත් වහන්න කාරුණික වන්න. නැත්නම් අහිංසක පරම්පරාවක් අවුරුදු 13 නේ 12 හෙ කිව්වා අද පාසල් ශිෂ්‍යයො. ඒ වගේම හැම වැඩපොලකම අහිංසක දූවා දරුවො මේ මත්පැන්වලට ඇබ්බැහිවෙලා. පුවත්පත අරගෙන බලන කොට හැමදාම මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් කෙනෙක් කොටුවෙලා තියෙනවා. ලක්ෂ ගණනක බඩු අහුවෙනවා. නමුත් අපේ ගම්වල තවම අපට අඩු වුනාද කියලා දැනුනෙ නැහැ. අපි රජයට ඇගිල්ල දික් කරනවා නෙවෙයි දැන් අසීමිත ලෙස බලය තියෙන වෙලාවෙ ඉහල තැන් කොටු කරන්න වගේම පහල තැන්වල නිලධාරින්ගේ ආශිර්වාදය නිසා මේ කටයුත්ත සිදු වෙනවයි කියන එකත් අපි කියනවා. අද ලංකාවෙ ප්‍රධානම කුඩු ව්‍යාපාරිකය බවට පත්වෙලා තියෙන්නෙ අපට ආරකෂාව සපයන්න හිටපු නාකොටික් කණ්ඩායම. එහෙම නම් එවැනි තත්වයක් තුල ඇත්තටම රජය වුනත් අපහසුතාවයකට පත්වෙනවා. මේක නතර කරන්නෙ කොහොමද කියලා. මුරකාරයට මුර කරන්න දෙනකොට මුරකාරයත් හොරෙක්නම්, ඇත්තටම අයිතිකාරයා අපහසුතාවයට පත්වෙනවා. අන්න ඒක නිසා අපි අපේ සියලුම සහයෝගය දීලා හරි රට ජාතිය සියල්ල බේරගන්න මේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරය නතර කිරීමට පක්ෂ බේදයකින් තොරව, ජති ආගම් කුල බේදයකින් තොරව, අපි අපේ සහයෝගය දෙනවයි කියන එකත් ප්‍රකාශ කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම පහුගිය දේශපාලන යුගයේ උඩවැලිවිටියෙ ගියා. උඩවැලිවිටියෙ ජනතාවට මගේ කාලෙ අපි වතුර දුන්නා. දැන් ඒ ජනතාවට අසාධාරණයක් සිදු වෙනවා. ඒ වතුර ටැංකිය හයිකරල තියෙන්නෙ පෞද්ගලික ඉඩමක. එයා ටැංකිය ලගින් ජනතාවට සැපයෙන එක නවත්වලා, පෞද්ගලික එයාගෙ යාන වාහන සෝදන්න සහ එයාගෙ පරිභෝජනය සඳහා සියල්ලම ගන්නවයි කියලා මට දැනගන්න ලැබුනා. මේක අප සතු වත්කමක් අපි සභාවෙන් ලක්ෂ ගණනක් වියදම් කරල තියෙනවා. ඒ නිසා මේක පෞද්ගලිකව එක පුද්ගලයෙක් භුක්ති විදිනවනම්, ඒක සම්පූර්ණම නීති විරෝධී ක්‍රියාවක්. විශේෂයෙන්ම මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඔබතුමා සාධාරණව මේක අධීක්ෂණය කරලා, වහාම වතුර දෙන්න අවශ්‍ය කටයුතු කරන්න. මේක කපන්න කිසිම හේතුවක් මත කිසිම කෙනෙකුට බැහැ කියලා මම හිතන්නෙ.

අවසාන වශයෙන් තමුන්නාන්සෙලගේ ආණ්ඩුව හෙට දවසේ දිවුරුම් දෙනවා. ඒකත් අපි අගය කරනවා. ඇමතිවරු 28 දෙනයි පත්වෙන්නේ ඒක නිසා ඒකත් අපි අගය කරනවා. එහෙමනම්, අපි සියලු රට වැසියා සියලු දෙනාම බලාපොරොත්තු වුන ඒ ගමන යන්න හැකියාව ලැබෙන්න කියල ප්‍රාර්ථනය කරමින්, මා නිහඩ වෙනවා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි, මම පොඩි අවස්ථාවක් ඉල්ලනවා. සභාවෙ අඩුපාඩුවක් හැටියට පෙන්වා දෙන්න ඕන. මම සභාවට පහුගිය කාලෙ තරාදිය ලයිසන් කර ගන්න ආවා. එතකොට මෙහේ තරාදි අළුත්වැඩියා කරන්න යම් මනුස්සයෙක් සභාවට ආවා. එතකොට එයා පිළිබඳ කිසිම තොරතුරක් මේ සභාවෙ නැහැ. දැන් එතකොට පිටස්තර කෙනෙක් ඇවිල්ලා, ඒ දේ කරගත්තනම්, ඒ පුද්ගලය කවුද කියලා මේ සභාවෙන් තමයි ඇවිල්ලා අහන්නෙ. එතකොට එයා ගැන තොරතුරක් දෙන්න බැරිනම්, ඇයි කෙනෙක් ගෙනැල්ලා සභාව පිටිපස්සෙ තියාගෙන ඒ දේ කළේ. එහෙම කරන්න බලය දෙන්නෙ මොකටද? එහෙමනම් අවශ්‍ය තොරතුරු ගබඩා කරගන්න ඕන.ඔය එක කාරණයක් මම කිව්වෙ. ඔය වගේ මොන දෙයකදි හරි ඇවිල්ලා

සභාවෙන් හොයල බලල බලන කොට මේ සභාවෙ කවුරුවත් දන්නෙ නැහැ. ඒ පිළිබඳව තොරතුරක් දෙන්න කෙනෙක් නැහැ.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. අද දිනයේ මම අදහස් ප්‍රකාශ කිරීමෙන් තොරව ඉන්න හැදුවෙ. නමුත් මේ අවස්ථාවෙ නැති වුනත්, පහුගිය මැතිවරණ කාලෙ ගැන විලේගේ මන්ත්‍රීතුමා යම් චෝදනාවක් කළා. එතුමා සඳහන් කළා උඩුගම පන්සලක තිබුන පිංකමක් ගැන. ඒකට මමත් ඒ අවස්ථාවෙ සහභාගි වුන කෙනෙක් නිසා, එතුමා මේ අවස්ථාවෙ නොහිටියත් ඒ ගැන යමක් ප්‍රකාශ කරන්න ඕන. මොකද ඔය කියන මැතිවරණ සමයේ, උඩුගම බෝධිරාජ පෙරහැර කමිටුව සහ උඩුගම ඒ පන්සලේ දායක සභාව මගින් වජිර අබේවර්ධන හිටපු ඇමතිතුමා වෙනුවෙන් ආශිර්වාද පූජාවක් පවත්වනවා කියලා අපටත් ආරාධනා කළා. කිරිපිඩු පූජාවක් විදිහට උදෑසන අපි ඒ ස්ථානයට සහභාගි වුනා. ඒක කිසිම දේශපාගන පක්ෂයකින් කරපු එකක් නෙවෙයි. ඒ පන්සලේ දායක සභාව සහ බෝධිරාජ පෙරහැර කමිටුව මගින් අපට නිල වශයෙන් ආරාධනයක් කළා. ඒ ආරාධනයට අපි සහ හිටපු ඇමතිතුමා සහභාගි වුනේ. එතන කිසිම දේශපාලන පක්ෂයක වැඩක් නෙවෙයි. අපේ සමන් මන්ත්‍රීතුමාගෙ කොට්ඨාසෙ නිසා එතුමාටත් මේක ආරංචි වෙන්න ඇති. වෙරංග මන්ත්‍රීතුමාටත් ආරංචි වෙන්න ඇති. ගරු සභාපතිතුමනි, පක්ෂ බේදයෙන් තොරව ඒ ගමට සහ බෝධිරාජ පෙරහැරට එතුමා අමාත්‍ය ධූරය දරන කාලෙ පෙරහැර ජාතික පෙරහැරක් විදිහට ගැසට් කරලා ඒ කරපු යුතුකම වෙනුවෙන්, එතුමාට ආශිර්වාද කරලා පූජාවක් තමයි ඒ ස්ථානයේ පැවැත්වුවෙ. ඒක විලේගේ මන්ත්‍රීතුමා කියපු විදිහට එතන කිසිම දේශපාලන සිද්දියක් වුනේ නැහැ. අනික මේ සිද්ධිය සිදු වුනේ අපටත් ආරාධනා කළා. මැතිවරණ ප්‍රචාරණ කටයුතු කරන්න පුලුවන් කාලෙ. නමුත් පන්සලේ එවැනි සිද්දියකුත් නෙවෙයි සිදු වුනේ. අපේ සහබන්දු මහත්තයත් දන්නවා. මම ඒ පන්සලට යනවත් අඩුයි. නමුත් මම ඒ ස්ථානයට සහභාගි වුනා. ඒ සහභාගි වුන නිසා තමයි ඒක නිවැරදි කිරීමක් විදිහට මේ අවස්ථාවෙ මතක් කළේ. විශේෂයෙන්ම උඩුගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමාට සහකාර මැතිවරණ කොමසාරිස්තුමා දිගින් දිගිටම හය වතාවක් කතා කරල තියෙනවා. ඒ ස්ථානයට ගිහිල්ල මේක පරීක්ෂා කරන්න කියලා. නව පොලිස් ස්ථානාධිපතිතුමා සහ ඉහල සියලුම නිලධාරීන් එතනට ඇවිල්ල ඒ වෙච්ච සියලුම දේවල් වීඩියෝ කළා. වීඩියෝ කරලා ඒ අය මම හිතන්නෙ වාර්තාවකුත් යවලා තියෙන්නෙ. නමුත් සභාවට ඇවිල්ලා අනිත් මන්ත්‍රීවරු නොමග යවන විදිහෙ කතාවක් තමයි විලේගේ මන්ත්‍රීතුමා කළේ. ඒක නිසා මම ඒ ස්ථානයට සහභාගි වුන කෙනෙක් විදියට ඒක නිවැරදි කරනවා. එවැනි දෙයක් එතන සිදු වුනේ නැහැ කියලා. එතන කිසිම දේශපාලන පක්ෂයක වැඩක් නෙවෙයි කියන එක සහ උඩුගම පොලීසියෙ ස්ථානාධිපතිතුමා ප්‍රමුඛ පොලිස් ස්ථානය සාක්ෂි දරනවා. මොකද ඒ අය ඒ වැඩසටහන අවසන්වෙනකල්ම ඒ ස්ථානයේ රැඳීසිටියා.

ඒ වගේම සභාපතිතුමනි, නැගී සිටපු හින්දා ඔබතුමන්ලට විශේෂයෙන්ම සුභ පතන්න ඕන. අපි පක්ෂ විපක්ෂ කවුරු වුනත්, මොන කණ්ඩායම නියෝජනය කළත්, දේශපාලනය කරන පිරිසක් විදිහට පහුගිය කාලෙ මැතිවරණයට මුහුණ දුන්නා. විශේෂයෙන්ම ඔබතුමාලා විශාල ජයග්‍රහනයක් ලබන කොට බලාපොරොත්තු නොවුන ආකාරයේ පරාජයක් තමයි අපට ලබන්න සිදු වුනේ. ඒ ගැන අපේ පක්ෂය වශයෙන් අපි පරාජය වුනත්, පක්ෂය විදිහට අපි ආඩම්බර වෙනවා. පහුගිය රජයක් කරපු පක්ෂයක් විදිහට පහුගිය කාලසීමාව පුරා මේ රටට මේ දිස්ත්‍රික්කයට විශාල වැඩ කොටසක් කරපු පක්ෂයක නියෝජිතයන් විදිහට අපි අදටත් ආඩම්බර වෙනවා. ඒ කරපු කාර්යය භාරයන් අද වෙන කොටත්, ඒවයි විශාල කොටසක් මේ වන විටත් ආරම්භ කරපු වැඩකටයුතු කරගෙන යනවා. ඒක නිසා මම ඒ ගැන විශේෂ විග්‍රහයක් කරන්න යන්නෙ නැහැ. විශේෂයෙන්ම අපේ සහෝදර වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමත්, සහබන්දු විපක්ෂ නායකතුමත්, ඒ ගැන සඳහන් කළා. උපක්‍රම ශීලීව ඒ අය ජයග්‍රහනය කළයි කියලා, අපේ වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමා කිව්වට, ඒක තමයි දක්ෂතාවය. මොකක් හරි මැතිවරණයකට ගිහිල්ලා ඡන්දය ගන්න පුලුවන්නම් ගන්න එක සහ අනිත් පැත්තෙ ඡන්ද නවත්වන එකත් දක්ෂතාවයක්. ඒක හරියාකාරව ඒ රජය

ක්‍රියාත්මක කළා. මේ සතියෙ තමයි ඔබතුමාලගෙ නියම රජය පත්වෙන්නෙ. පහුගිය මාස ගණන අපි භාරදීපු රජයක් තමයි ඔබතුමන්ලා භුක්ති වින්දෙ. ඒ ඇමතිධූර සහ සියලු වරප්‍රසාද භුක්ති වින්දෙ අගමැති ධූරය පවා භුක්ති වින්දෙ අපි අයින් වෙච්ච නිසා. ඒක නිසා දැන් ඔබතුමන්ලා බලාපොරොත්තු වුන ආකාරයටත් වඩා එහා ගියපු විශාල බලයක් සහිත වගකීමක් ඔබතුමන්ලට ලැබුනා. ඒක බලය කියනවට වඩා මම කැමතියි වගකීමක් කියන්න. දැන් විලේගේ මන්ත්‍රීතුමා මේ සභාවෙදි කතා කළා. අපි කවුරුත් එක විදිහට පත්වෙලා, කොට්ඨාස දිනලා

ආපු අය. නමුත් ඒ තමන්ට තියෙන බලයට ඔබතුමාට වගකීමක් භාරදුන්නා. ඔබතුමා සභාපති කළා. ඒ වගේ ඔබතුමන්ලට එකසිය හතලිස් ගණනක මන්ත්‍රීධූර පිරිසකුත් එක්ක ලැබුනේ විශාල බලයක් කිව්වට, ඒක වගකීමක්. ඒ වගකීම පාවිච්චි කරන ආකාරය අනුව තමයි මහජනතාව බලාපොරොත්තු වන දේ ඉටු වේවිද නැද්ද කියලා ඉදිරියෙදි මහජනතාවගේ ප්‍රතිචාරය දැක ගන්න පුලුවන් වෙන්නෙ. අපි ඔබතුමන්ලට ප්‍රාර්ථනා කරනවා. ඔබතුමන්ලා ඒ බලය හරියාකාරව පාවිච්චි කරලා, මේ රට වෙනුවෙන් කරන්න පුලුවන් ඒ මහජනතාව බලාපොරොත්තු වන, එහෙම නැත්නම් එක්සත් ජාතික පක්ෂය රජයට කරන්න බැරි වුන දෙයක් තියෙනවනම්, ඒ කටයුත්ත කරන්න ඔබතුමන්ලට හැකි වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි, අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල විශේෂයෙන්ම මම නියෝජනය කරන ගෝනදෙනිය සහ උඩුගම අවට මත්කුඩු ඉස්සර තිබුනෙ නැහැ. මේ සභාවල කතා කරන්න අපට එහෙම දේවල් තිබුනෙ නැහැ. දැන් මත් කුඩු, ගංජා සහ වෙනත් ඒ වගේ දේවල් ඉතාමත් බහුලව, ඉතා සූක්ෂම ආකාරයෙන් බෙදා හැරීම් සිදු කරනවා. ඊසි කැෂ් මගින් සල්ලි දානවා. දවසම හම්බු කරලා, එහෙම නැත්නම් හොරකම් කරලා, අනුන්ගෙ තේ පැල ටිකක් හොරාට ගලවලා, කාගෙ හරි පොල් කඩලා, එහෙම නැත්නම් පුවක් ගෙඩියක්වත් ගහක තියා ගන්න බැරි තත්වෙට පත්වෙලා තියෙනවා. විශේෂයෙන්ම අපේ ප්‍රදේශයේ ඉඩමෙ දලු කඩලා, දලු මඩුවෙ දලුටික තියෙන කොට ගෝනිය ගෙනැල්ල දලුටික දාගෙන ගිහිල්ලා, ඒක විකුනලා හවසට රුපියල් දාහ දෙදාහ ඊසි කැෂ් දානවා. ඒ වගේ දාලා කොහේ හරි තියෙන මත් ද්‍රව්‍ය ටිකක් ගෙන්න ගෙන ඒව භුක්ති විදිනවා. අද වෙන කොට ගෑනු ළමයෙකුට පාරෙ තනියම යන්න බයයි. පන්තියකට ගෑනු ළමයෙක් තනියම යවන්නෙ නැහැ. ඒ වගේ විකාර වෙච්ච පිරිසක් ඉන්නවා. හැමෝම නෙවෙයි. හැම ගමකම මේ මත්ද්‍රව්‍ය ප්‍රශ්නය දැන් ව්‍යාප්ත වෙමින් පවතිනවා. දැන් ඔබතුමන්ලට අවස්ථාව ලැබුනම, ඒ ජාතික මට්ටමේ වැඩපිළිවෙලට සහයෝගයක් විදිහට, අපේ බල ප්‍රදේශයේ ඒ අදාල අංශ දැනුවත් කරලා, වහාම යම් ක්‍රමවේදයකට කටයුතු කරන්න. මේ සම්බන්ධව ඔබතුමන්ලගෙ අවදානය යොමු කරලා, අදාල ස්ථාන දැනුවත් කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම මේ අවස්ථාවෙදිම කියන්න ඕන. පහුගිය කොවිඩ් වසංගතය දවස්වල අපේ වෙරංග මන්ත්‍රීතුමා දන්නවා ඇති. උඩුගම සහ සියලුම ප්‍රදේශවල ඔය එක එක ආයතනවල පහසුකම් සපයන්න ගිහිල්ලා, මිල වැඩිවීම් වුනා. එක උදාහරණයක් තමයි කොණ්ඩ කපන සැලුන්වලට මේ ආකායෙන් කරන්න ඕන කියලා නීතිරීති පැනෙව්වා. මුදල් අය කරන්න කියලා කිව්වා. නමුත් ඒ අය ඒ අවස්ථානුකූලව ඒක කළා. අද වෙන කොට කිසිම පහසුකමක් නැතුව හැම සැලුන් එකකම රුපියල් 100 ට 120 ට 150 ට තිබුන කොණ්ඩ කපන එක දැන් 300 යි. නමුත් අර කියන වරප්‍රසාද පහසුකම් මොකුත් නැහැ. සමාජ දුරස්ථභාවය හෝ පහසුකම් නැතුව තමයි ඒ ආකාරයට අය කරන්නෙ. ඒක මහජනතාවට ලොකු අසාධාරණයක්. අපේ සභාවට ඒ සඳහා පුලුවන් ආකාරයෙන් මැදිහත් වෙලා, අදාල අංශ දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා. මම කියන්නෙ හැමෝටම නෙවෙයි වැඩිහරියක් දුප්පත් ජනතාව තමයි ඒවට යන්නෙ ඒ ගැනත් සැලකිලිමත් වෙන්න. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ සභාවට මාධ්‍යවේදීන්ගෙ පැමිණීම මාස හයක විතර ඉදලා අපි දැක්කෙ

නැහැ. ඒක නිසා සභාපතිතුමනි, එතුමන්ලටත් ආරාධනා කරලා, මේ සභාවෙ වෙන හොඳ නොහොඳ සියලුම දේ රටට පළාතට දැනගන්න කටයුතු සලස්වන්න කියලත් ඉල්ලා සිටිමින්, මම නිහඩ වෙනවා. සියලුම දෙනාට ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී කේ. කේ. අයි. නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. මේ අවස්ථාවෙ මම නැගී සිටියේ අපේ සහබන්දු මහත්මයා උඩවැලිවිටිය ප්‍රදේශයේ වතුර ගැන සඳහන් කළා. ගරු සභාවේදී ඒ ගැන මම කිහිප වතාවක් ඒ ගැන අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටියා. ලක්රුවන් මන්තීතුමත් පහුගිය දිනවල ඔය ගැන සඳහන් කළා. පල්ලෙහා තියෙන එක පැත්තකට වතුර ලැබෙන්නෙ නැතෙයි කියලා. ඒ ගැනත් මතක් කරනවා. තවත් අපි එක්සත් ජාතික පාක්ෂිකයන් වශයෙන් මුලින්ම අපි ඒ ඡන්ද ව්‍යාපාරය පටන් ගන්න කොට දෙන්න තුන්දෙනෙක් තමයි අපට සොයා ගන්න හැකියාව ලැබිල තිබුනෙ. සමහරු අපට උදම් ඇනුවා. පෝලිම් හුත් එකටවත් දාගන්න සාමාජිකයො නැත කියලා. නමුත් ඒ අවස්ථාවෙ නොබියව ඉදිරිපත් වුන ඒ සියලුම දෙනාටත්, ඒ වගේම එක්සත් ජාතික පක්ෂයේ අලියා ඉදිරියෙ නොබියව කතිරය ගහපු එක්සත් ජාතික පාක්ෂිකයන් සියලුම දෙනාටත්, මේ අවස්ථාවෙ මගේ ස්තූතිය පුදකරනවා. ඒ වගේම ඉදිරි අනාගතයේදී අපි අපේ පක්ෂය අපට හැකි අන්දමින් නගා සිටවන්න උත්සාහය දරනවා. සියලුම දෙනාට ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ගරු මන්ත්‍රීවරුනි, අපි දුන් පොරොන්දුව සහ යුතුකම ඉටු කරලා, රටේ ආරක්ෂකයා පත්කරපු වකවානුවක, ඔබතුමන්ලා කියපු සියලුම දේවල් ඉටු වෙනවා. ඒ එක්කම මම පළමුවෙන් කියන්න ඕන. මේ නාගොඩ ප්‍රාදේශීය සභාව කියන්නෙ විශේෂිත වූ ප්‍රාදේශීය සභාවක්. මෙදා අපේ ප්‍රාදේශීය සභාව අයිති ආසන දෙකේම මන්ත්‍රීවරු දෙපොල විශිෂ්ඨ අන්දමින් ජයග්‍රහනය කරවලා පාර්ලිමේන්තු යවලා තියෙනවා. ඒ එක්කම මේ සභාවෙන් බිහි වුන මන්ත්‍රීවරු දෙපොලටම අද මන්ත්‍රී ධූරය අහිමි වෙලා තියෙනවා. අපේ නිශාන්ත මුතුහෙට්ටිගම නියෝජ්‍ය ඇමතිතුමා ඡන්දය ඉල්ලුවෙ නැහැ. විජේපාල හෙට්ටිආරච්චි ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රාදේශීය සභාවෙ හිටපු සභාපතිවරයෙක්. එතුමාත් අද මන්ත්‍රී ධූරය අහිමි වෙලා ඉන්නවා. ඒ ගැන කණගාටු වෙනවා. නාගොඩ ප්‍රාදේශීය සභාව සම්බන්ධ ආසන දෙක අපිව මෙහෙයවපු, අපි බලාපොරොත්තු වුන, නායකත්ව දෙපල විශිෂ්ඨ අන්දමින් ජයග්‍රහනය කිරීම පිළිබඳව සතුටු වෙනවා. සම්පත් අතුකෝරල වර්තමාන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, අපේ හිනිදුම ආසනයේ නායකත්වය ගෙන කටයුතු කළා. ඒ වගේම ඉසුරු දොඩංගොඩ මැතිතුමා බද්දෙගම ආසනය බාරගෙන නායකත්වය ගෙන කටයුතු කරමින්, වර්තමානයේ මන්ත්‍රීවරු හැටියට පත්වෙලා ඉන්නවා. ඒ පිළිබඳ අපි සතුටු වෙන ගමන්ම, අපි එතුමන්ලගෙ සහය අපේක්ෂා කරනවා. අනාගතයෙදි මේ ප්‍රාදේශීය සභාවට විශේෂ අන්දමින් සලකයි කියලත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ එක්කම හිනිදුම ආසනය ගත්තම, පසුගිය මැතිවරණයෙදි සියලුම අපේක්ෂයන්ට සාධාරණයක් ඉටු කරලා තියෙනවා. ඒ තමයි මොහාන් පී ද සිල්වා මැතිතුමාට මනාප 7448 ක් ලබා දීල තියෙනවා. සම්පත් අතුකෝරල මැතිතුමාට 40165 ක් ලබා දීලා තියෙනවා. ගාමිණී අමරවංස මැතිතුමාට 1131 ක්, දිල්ශාන් විදාන ගමගේ මැතිතුමාට 1237 ක්, ඉසුරු දොඩංගොඩ මැතිතුමාට 8073 ක්, පුෂ්පලාල් කුමාරසිංහ මැතිතුමාට 1279 ක්, ගීතා කුමාරසිංහ මැතිනියට 5195 ක්, චන්දිම වීරක්කොඩි මැතිතුමාට 7116 ක්, චන්න මෙන්ඩිස් මැතිතුමාට 1059 ක්, බද්දෙගම සමිත හිමිට 2782 ක්, රමේෂ් පතිරණ ඇමතිතුමාට 19452 ක්, ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමාට 5357 ක්, හැටියට මනාප බෙදිලා තියෙනවා. ඒ කියන්නෙ අපේ හිනිදුම ආසනයේ සියලුම අපේක්ෂකයන්ට යම් මට්ටමින් උපකාර කරමින් කටයුතු කරල තියෙනවා. ඒ නිසා මම හිතන්නෙ අපට සාධාරණයක් වේවි. විශේෂයෙන්ම මෙවර මැතිවරණයෙදි කවදාවත්ම නොවූ වාර්තා රැසක් බිහි වුනා. ඒ තමයි හිනිදුම ආසනේ පළවෙනි වතාවට ලක්ෂය ඉක්මවා

මනාප රැගෙන පාර්ලිමේන්තුවට ගිය පළමු අපේක්ෂකයා හැටියට සම්පත් අතුකෝරල මැතිතුමා ඉතිහාස ගත වෙනවා. ඒ වගේම තමයි ලක්ෂ දෙක ඉක්මවපු පළමු කෙනා හැටියට රමේෂ් පතිරණ ගරු අමාත්‍යතුමා සමාජගත වෙනවා. ඒ වැඩිම මනප ගැනීම සම්බන්ධව. ඒ අනුව ගාලු දිස්ත්‍රික්කය දිහා බැලුවම අපි සතුටු වෙන්න ඕන. ඒ එක්කම හිනිදුම ආසනේ තමයි 74% ක් වැඩිම ඡන්ද ප්‍රතිශතයක් දීපු, පාවිච්චි කරපු ආසනය. අපි ඒ ගැනත් සතුටු වෙනවා. මොකද ඒ අපේ කැපවීම හා උනන්දුව මත තමයි ඒ කටයුත්ත කළේ. අපි අපේ වනමල් මන්ත්‍රීතුමා කිව්ව වගේ කිසි කෙනෙකුට ඇත්තටම බලපෑම් කලේ නැහැ. අපි නිතරම කිව්වෙ එන්න අප හා එක්වන්න. මොකද අපට කෝවිඩ් වසංගතය දැන් අමතකයි. එහෙම එකක් තිබුනයි කියලවත් මතක නැහැ. අද සභාවත් මේ ආකාරයට මෙහෙයවන්න අපට වාසනාව ලැබුනා. මේ කෝවිඩ් වසංගතය අපට වාසනාවක් වුනා. ලෝකයේ හැම රටකටම ඒක අවාසනාවක් වුනාට, ලංකාවට ඒක වාසනාවක් වුනා. අපේ මරණ සංඛ්‍යාව අඩුයි. ව්‍යාප්තිය නම් තවම චුට්ට චුට්ට වැඩිවෙනවා. ඒ පිට රටින් එන අය. නමුත් ඒකෙදි පළමුවෙන්ම වර්තමාන අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ වැඩපිළිවෙල මිනිස්සු දැක්කා. එතුමාගේ ඒ වැඩපිළිවෙලට මිනිස්සු සතුටු වුනා. ඒ සියලු දේ සලකලා ගෝඨාභය මහත්තය වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කළා. ලංකාවෙ 71% ක ඡන්ද ප්‍රතිශතයක් ලැබෙයි කියලා, අපි කවුරුවත් බලාපොරොත්තු වුනේ නැහැ. අපි හිතුවෙ 50% ටත් අඩු ඡන්ද ප්‍රතිශතයක් වෙයි කියලා. මිනිස්සු ඡන්දෙ දෙන්න යන එකක් නැහැ කිව්වා. නමුත් මුලු ලංකාවෙම වැදගත් විදිහට එක්කෝටි විසිහය ලක්ෂයක් ඡන්ද පාවිච්චි කළා. ඒකෙන් හත් ලක්ෂ ගණනක් හැබැයි ප්‍රතික්ෂේපයි. අපි ඒකෙ අඩුපාඩුවක් දකින්නෙ අපි මනාප පසුපස ගියා. ඡන්දය දෙන ආකාරය ගැන දැනුවත් කරන්න බැරි වුනා. ඒ නිසයි ඒක වුනේ. නමුත් වැඩි ප්‍රතිශතයක් ඡන්දය දීලා ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ සෞභාග්‍යයේ දැක්මට ආශිර්වාද කිරීම පිළිබඳ, මේ ඡන්ද දීපු සියලු දෙනාට අපි ගරු කරනවා. ඒ වගේම දැවැන්ත පක්ෂයක් වූ එක්සත් ජාතික පක්ෂය මේ තත්වයට ඇද වැටීම පිළිබඳව අපි කණගාටුවට පත්වෙනවා. විශේෂයෙන්ම අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමාටත් යම් අවස්ථාවක මේ මන්ත්‍රී ධූරයක් ලැබෙයි කියලා අපි ඇත්තටම බලාපොරොත්තු වුනා. මම පෞද්ගලිකව බලාපොරොත්තු වුනා. මොකද එතුමා මේ සභාවට අපි විපක්ෂයේ හිටියත් සභාවේ බලය අපට තිබුනට අපි ඒ දවස්වල විපක්ෂයේ. නමුත් අපට ලක්ෂ 200 ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කළා. නමුත් ඒ මුදල අපට ලබා ගන්න හැකියාව ලැබුනෙ නැහැ. මොකද ඉඩම අපට පැවරී නොතිබුන නිසා. ඒ වගේම ගයන්ත ඇමතිතුමත් අපට ඉඩම් පිළිබඳව කටයුතු කිරීමෙදි සහය දැක්වුවා. ඒ පිළිබඳව අපි ඇත්තටම මේ අවස්ථාවෙ සිහිපත් කරනවා. මොකද එතුමන්ලා අපට දක්වපු සහයට කෘත ගුණ සලකනවා. මොකද ඒ සියලු මන්ත්‍රීවරුත්, ඇමතිවරුත් කවුරුත් මෙතනට එන්නෙ වැඩක් කරන්න. ඒ වගේම තවත් කණගාටුවට පත්වෙනවා. විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමාටත්, නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමාට ඇත්තටම ඡන්දෙ ඉල්ලන්න අවස්ථාව ලැබුනෙ නැහැ. ඒ දෙපොලගේ පාර්ලිමේන්තු නොයාම පිළිබඳ ඇත්තටම අපේ යම් කණගාටුවක් තියෙනවා. කොහොම නමුත්, අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ට, ඒ වගේම අතිගරු අපේ හදවතේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිදුන්ට ලොකු ශක්තියක් වෙන්න. තුනෙන් දෙකේ බලයක් අපි ඉල්ලුවා. අපි මහින්ද මහත්තය පරාජය ලබල ගියාට පස්සෙ. අපි එතුමාට කිව්වා. ඔබතුමා දේශපාලනයෙන් විශ්‍රාම යවන්නෙ මේ රටේ නැවත නායකත්වයට අරගෙන කියලා. ඒ නායකත්වයට අරගෙන තුනෙන් දෙකේ බලයක් අරගෙන දෙනවයි කිව්වා. අපි ඒ පොරොන්දුව ඉටු කළා. සභබන්දු මැතිතුමනි, ඊලගට යුතුකමත් අපි ඉටු කළා. මොකද එතුමා පසුපස හිටපු සියලුම නායකයන් අපි පත් කළා. කොහොම නමුත් ඒ සියලු දේවල් කළාට, තුනෙන් දෙක ලැබුනට මිනිස්සුන්ට දැන් අපි කියන්න ඕන. අපි නාගොඩ ප්‍රාදේශීය සභාව අවුරුදු දෙකක විතර ආසන්න ප්‍රමාණයක් එක්සත් ජාතික පක්ෂය යටතේ තිබුනෙ. යම් මූල්‍ය ප්‍රතිපාදන නොලැබුන නිසා, පළාත් සභාවෙනුත් අපට නොලැබුන නිසා, අපි ඇත්තටම පසු පෙළට වැටුනා. නමුත් අපි බලාපොරොත්තු වෙනවා. ප්‍රතිපාදන නැහැ කියලා, පහසුකම් නැහැ කියලා මෙවර අපට කියන්න බැහැ. මොකද අපි බලාපොරොත්තු වෙනවා. අපේ පක්ෂයේ ගරු මන්ත්‍රීවරු 15 දෙනාම කරුණාකරල තමන්ගේ බල ප්‍රදේශයේ වැඩකටයුතු කරන්න. ගරු මන්ත්‍රීවරුන්ගෙ ප්‍රතිපාදන ලබාගෙන, ඒ අදාල ආයතන එක්ක සම්බන්ධ වෙලා කටයුතු කරන්න උනන්දු වෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම

නාගොඩ ප්‍රාදේශීය සභාව හැටියට අපි බලාපොරොත්තු වෙනවා සභබන්දූ මන්ත්‍රීතුමා ප්‍රකාශ කල, ආදාහනාගාරයේ වැඩ කටයුතු මම හිතන්නෙ අපට මේ ලඟදිම පටන්ගන්න පුලුවන් වේවි. ඒ වගේම නාගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය, ඒක අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගෙ උඩුගම හෝමදොලදි පැවති පළමු ගාලු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ගත් පළමු යෝජනාව හැටියට එය ඉදිරියේදී ක්‍රියාත්මක වෙනවා. මම දැක්කා පසුගිය පත්තරේක මිලියන හාර දහසක් ගාලු නගරයට සහ නාගොඩ, තවලම, ඉමදූව නගරවල සංවර්ධනයට වෙන් කරල තියෙන බව. එය අපි සතුටින් ප්‍රකාශ කරනවා. ඒ එක්කම කාපට් පාරවල් පිළිබඳව අපි සියලු මන්ත්‍රීවරු දැනුවත් කළා. කාපට් පාරවල් දැන් මේ වෙන කොට ටෙන්ඩර් කරුවන් අරගෙන, දැන් ව්‍යාපෘති සකසනවා. ඒ සම්බන්ධව මම ගිය වරත් සඳහන් කළා. පහුගිය දවස්වල ඡන්දෙ නිසා වැඩ කටයුතු පොඩ්ඩක් නතර වුනා. අපි උත්සව තිබ්බෙ නැහැ. නමුත් ඒව පටන්ගෙන වැඩකටයුතු කරනවා. යටලමත්ත- මාමනදොල මාවත කිලෝ මීටර් පහමාරක දුරක් , අලුත්වත්ත සිට බංගම දක්වා කිලෝ මීටර් පහමාරකුත් කාපට් වෙනවා. පඤ්ඤාලෝක මාවත මේ වෙන කොට පටන් ගෙන. ඒ ආදී කොට ඇති හුගක් මාර්ග ටෙන්ඩර් කරුවන් අරගෙන වැඩකටයුතු කරන්න පටන් අරගෙන තියෙන්නෙ. කොහොම නමුත් අපි ඉදිරියෙදි බලාපොරොත්තු වෙනවා. අපේ තියෙන සියලුම පාරවල්වල අඩුපාඩු සකස් කරලා වැඩකටයුතු කරන්න.

ඒ එක්කම ජල ව්‍යාපෘති පිළිබඳව සඳහන් කිරීමේදී, සියල්ලට විදුලිය සේම, සියල්ලට ජල පහසුකම් ලබා දීමත් අතිගරු ගෝඨාභය මැතිදුන්ගේ සෞභාග්‍යයේ දැක්ම යටතේ තියෙනවා. ඒ වගේම මම කියන්න සතුටුයි. අපේ මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ වුන ආකාරයට, අපි පෞද්ගලිකව දන්නවා. තුනෙන් දෙකේ බලය ඇතත් නැතත්, ලංකාවේ පාතාලය සහ කුඩු විනාශ කරනවයි කියලා අපට ප්‍රතිඥාවක් දුන්නා. අපි කැඳවලා ඒක අපිට ප්‍රසිද්ධියෙම කිව්වා. ඒ නිසා මම බලාපොරොත්තු වෙනවා. රටේ දරුවන්ගෙ අනාගතය රැක ගන්න. පාතාලය සහ කුඩු නිර්මාපකයන් අවසන් කරලා, රට හොඳ අතකට, ගුණයහපත් දරුවන් බිහිවෙන ගුණ යහපත් රටක් හැටියට පත් කිරීමට අවශ්‍ය වැඩකටයුතු කරයි කියලා.

ඒ වගේම තමයි සභබන්දූ මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීවරුනි, අපි ඇත්තටම මේ සතුට සියලු දෙනා සමඟ වින්දෙ. මොකද අපි බලාපොරොත්තු වුනා මේ ජයග්‍රහනය. අපිට අලුත් ජයග්‍රහනයක් නෙවෙයි මේක. අපි බලාපොරොත්තු වුන ජයග්‍රහනයක්. මේ සියලු දෙනා අපිට ඡන්දය දුන්නා. ඒ ඡන්දය දුන්නෙ ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ විශ්වාසය තුල. මහින්ද රාජපක්ෂ මහත්තයට තියෙන විශ්වාසය තුල. ඒ විශ්වාසය කඩ කළොත් ඔයාලට වගේම අපටත් ඔය දේ වෙන්න පුලුවන්. ඒ නිසා අපි ඒ විශ්වාසය රකිනවා. විශ්වාසය රැකලා අපි සියලු දෙනත් එක්කම එක ගමනක් යන්න ආරාධනා කරනවා. යම් යම් දේවල්වලදි යම් යම් අඩුපාඩු වෙයි. අපට 100% ක් කරන්න බැරි වෙයි. රැකියාවලදි නම් දන්නෙ නැහැ. පොදු වැඩවලදි ගමේ සංවර්ධනයෙදි, අපි සියලු දෙනා එකාවන්ව වැඩ කරමු. එතකොට අපට කවුරුවත් මොනවත් කියන එකක් නැහැ. ඒ නිසා මම මීට වඩා යමක් කියන්න යන්නෙ නැහැ. පත්වුන අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ට ශක්තියක් වෙන්නට පත්වුනු අපේ හදවතේ ජනපති මහින්ද රාජපක්ෂ මැතිදුන්ටත්, ඒ වගේම එතුමාට ශක්තිවන්ත වෙන්න කැබිනට් මණ්ඩලය රමේෂ් පතිරණ මැතිතුමා, මොහාන් පී ද සිල්වා මැතිතුමා ප්‍රමුඛ ඒ කැබිනට් මණ්ඩලයටත්, අපේ ආසනයේ නායකත්වය දරමින්, අපට ලොකු ශක්තියක් වුනු මෙවර මනාප ලැයිස්තුවේ ඉහලින්ම ඉන්න. අපේ සම්පත් අතුකෝරල මැතිතුමාටත් සුභ පතමින්, ඒ වගේම ඉසුරු දොඩංගොඩ අපේ තරුණ මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවෙ තරුණම ලාබාලතම මන්ත්‍රීවරය හැටියට පත්වෙලා යන්නෙ. එතුමාගෙ නිහතමානිත්වයට එතුමාට හුගක් දෙනා ආශිර්වාද කළා. එතුමාටත් ඒ එක්කම පත්වුන අපේ සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලටත් අපේ ආශිර්වාදය පුද කරනවා. අද දින සභාවට සියළු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා පැමිණ සහභාගී වී සියළු දෙනා සමඟ සුහදව සංග්‍රහ භුක්ති විදිමින් කටයුතු කල ආකාරය පිළිබඳව මම ඉතාමත් සතුටු වෙනවා. මම හිතන්නෙ මේ ප්‍රාදේශීය සභාවෙ විතරක් වෙන්න ඇති ඔයවැනි ආකාරයෙන් කටයුතු කරන්නෙ. මෙවැනි සුහද ලීලාවෙන් කටයුතු කරන ප්‍රාදේශීය සභා අඩුයි. මේ සභාවෙ කටයුතු සියලු දෙනත් එක්කම එකතු වෙලා කරන්න ඉදිරියෙදි මම

බලාපොරොත්තු වෙනවා. ධනංජය මන්ත්‍රීතුමා අදහස් කල පරිදි නාගොඩ උඩුගම කියල බේදයක්නම් නැහැ. ඇත්තටම හිතේ එහෙම තියෙනවනම් ඒව අයින් කර ගන්න. නාගොඩ උඩුගම කියන්නෙ දෙකක් නෙවෙයි. එකම ගම්. එකම ඥාතිවරු, එකම අය ඒක නිසා එහෙම බේදයක් නැහැ. නමුත් යම් යම් අවස්ථාවලදි එහෙම කියනවා. සමහර වෙලාවට කියනවා උඩුගම සභාපතිවරු හතර දෙනෙක් හිටියා කෝ අපට කළාද කියල අහනවා. ඒවා ප්‍රශ්න නෙවෙයි. ඒ නිසා යම් යම් අඩුපාඩු වෙයි. සමන් මන්ත්‍රීතුමාගේ අදහස් ඉදිරිපත් කිරීමේදී සහ ධනංජය මන්ත්‍රීතුමාගේ අදහස් ඉදිරිපත් කිරීමේදී, ඉදිරිපත් වූ කරුණු මා දැඩි සේ හෙලා දකිනවා. මන්ද, මම බලහත්කාරයෙන් උඩුගම, හෝමදොල තිබුන ගල් ගෙනාවෙ නැහැ. එම ගල් එම පාර සෑදූ කොන්ත්‍රාත්කරු මාගේ ඉල්ලීම මත දුන් ABC ගල්, ඒවා ආරක්ෂක ස්ථානයකට ගෙනවිත් දමන තුරු තමයි එම ගල් එම ක්‍රීඩාපිටියේ දමා තිබුනෙ. එදින එම ස්ථානයෙන් ගල් ගෙන ආවේ වෙරංග මන්ත්‍රීතුමාගේ බල ප්‍රදේශයේ ගිලා බැස තිබූ ගමගොඩ බෝක්කුව සෑදීම සඳහා වන අතර, නැතිව මාගේ පෞද්ගලික වැඩකට නොවේ. ඒවගේම ධනංජය මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය අනුව සභාපතිගේ බලතල අනුව තමයි මම වැඩ කරන්නෙ. පෙර වාගේ නෙවෙයි.විනිවිදභාවයෙන් මම වැඩ කරන්නෙ. මම සභාපතිකම බලෙන් ලබාගත් දෙයක් නොවන බව වටහාගන්න. 2002 වර්ෂයේ සිට මම මෙම සභාවේ ඉහළ මනාප ලබා ගනිමින් කටයුතු කළා. කොරෝනා කාලයේ ඔබතුමාලා හැසිරුන ආකාරය තමයි හොද නැත්තෙ. ඒ පිළිබඳ මම නැවත සිහිපත් කරන්නෙ නැහැ. නමුත් ඔයාල සියලු දෙනාගෙ ආශිර්වාදය සභාවටත්, මුලු ජනතා ව්‍යාපාරයටත් ලැබේවා කියල ප්‍රාර්ථනා කරමින්, අද සහභාගි වුන සියලුම මන්ත්‍රීතුමන්ලට, මන්ත්‍රීතුමියන්ලට ස්තූතිවන්ත වෙමින්, අනාගත පාර්ලිමේන්තුවේ වැඩකටයුතු ඉතා සර්වප්‍රකාරයෙන් සාර්ථක වෙන්න අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ සෞභාග්‍යයේ දැක්ම 2030 වර්ෂය වෙනකම් දීර්ඝව ඉතිහාසයට ඇතුලත් වෙන ආකාරයට කටයුතු කරන්නත් හැකියාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා. සැමට ජය වේවා. බොහොමත්ම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                        දිනය:- .............................